# 2022.01.11 මහා සභා රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීවරුන්

01.ප්‍රාදේශීය සභා ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා
02.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා
03. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
10.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා
11.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා
12.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා
13.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි. සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
14.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා
15.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
16.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය
17.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය
18.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය
19.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා
20.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
21.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා
22.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා
23.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා
24.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය
25.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා
26.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා
27.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා
28.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා
29.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා

**<u>රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්</u>**

01.ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
02.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා

07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය

**ආගම සිහි කිරීම.**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය, ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූලව ආරම්භ කරන ලදී.2022 ජනවාරි මස මහා සභා රැස්වීමට සහභාගි වන ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මණ්ඩලය ,ලේකම් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියලු දෙනාට ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා 2022 වර්ෂය ඉතාම සෞභාග්‍යය සම්පන්න වාසනාවන්ත නිදුක් නිරෝගී සුභ නව වසරක් හා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## 01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

## I.2021.12.14 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2021.12.14 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාවේ අඩුපාඩු ඇත්නම් එය පෙන්වා දෙන ලෙසත් , එසේ නොමැති නම් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලෙසත් දන්වා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2021.12.14 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (ජ.ජ.නි.ස.)</u>**

2021.12.14 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>සංශෝධන 01</u>**

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (ජ.ජ.නි.ස.)</u>**

ලැබුවා වූ නව වසර සියලු දෙනාටම සුභම සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.2021.12.14 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 43 හි මගේ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම වාර්තාගත වී නෑ. මගේ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම වාර්තාගත කරන ලෙස ඉල්ලීමක් කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,අතපසුවීමක් සිදු වෙන්න ඇති.එය නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස නිලධාරී මණ්ඩලයට දන්වා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (ජ.ජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි,ඊයේ සිදු වූ සිදුවීම ගැන කතා කිරීමට අවස්ථාව ලබාදීම ගැන මා ඔබතුමාට පළමුව ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා.ඊයේ දිනයේ ගරු උප සභාපතිතුමා ප්‍රමුඛ පොදුජන පෙරමුණේ මන්ත්‍රී කණ්ඩායම රජයේ දේපලවලට ගිනි තැබීමට තැත් කිරීම පිළිබඳ අවස්ථාව. ගරු සභාපතිතුමණි,මා කතාව ආරම්භ කිරීමට ප්‍රථමව ගරු සරත්චන්ද්‍ර ජයතිලක ගරු මන්ත්‍රීතුමාට සිහිපත් කරනවා ගරු මන්ත්‍රීතුමණි,දේශපාලන පක්ෂවල නියෝජිතයන් වශයෙන් ඉදිරිපත් කරනකොට විවිධාකාර පුද්ගලයන් ඒ සඳහා ඉදිරිපත් කරනවා.ඒ අවස්ථාවල කසිප්පුකාරයින්,කුඩුකාරයින්,ගණිකා වෘත්තිකයන් ආදී මේ හැමෝම ලැයිස්තුවල සිටිනවා.ඔබතුමා ප්‍රකාශ කලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රත්මල්ල කොට්ඨාසයෙන් ඉදිරිපත් වූ තිලකරත්න මහතා කසිප්පුකාරයෙක් කියලා.එය ඉල්ලා අස්කර ගන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.සෑම දේශපාලන පක්ෂයකම විවිධාකාර නරක මිනිස්සු සිටිනවා.එතුමා 2018 ප්‍රාදේශීය සභා මැතිවරණය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් වූ අපේක්ෂකයෙක්.මා ඔබතුමාට ප්‍රකාශ කරනවා එවැනි ප්‍රකාශ ඉල්ලා අස්කර ගන්නා ලෙස.

ගරු සභාපතිතුමණි,මේ ප්‍රශ්නය ඇති වුනේ හිටපු ගරු සභාපතිතුමාගේ අභාවයත් සමඟ.මං හිතන්නේ මෙතුමන්ලාට අමතක වෙලා ඇති මේ කටයුත්තේ දී අපට නිරන්තරයෙන්ම අනුසාශනා කල දිග්ගලගෙදර වහන්තරේ ස්වාමීන් වහන්සේ.හිටපු ගරු සභාපතිතුමාගේ අභාවය සැලවූ සැණින් උන්වහන්සේ මේ ස්ථානයට වැඩම කරලා සියලුම දේශපාලන පක්ෂ නායකයින් හා ලේකම්තුමා සමඟ සාකච්ඡා කලා අවසන් කටයුතු සිදු කරන ආකාරය හා අපි ඉදිරියේ දී කටයුතු කරන ආකාරය පිළිබඳව.උන්වහන්සේ වැඩමකලා පාංශුකූල කටයුතු සඳහා කොටිකාවත්ත ආදාහානාගාරයට.එහිදී උන්වහන්සේ දුටුවා කොටිකාවත්ත ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා හා ගරු උප සභාපතිතුමා ක්‍රියා කල ආකාරය.ඉතා සුහදව කරට අත දාගෙන සමගිව කටයුතු කල අයුරු.එය පූර්වාදර්ශයට අරන් අපේ සභාව තුලත් සමඟියෙන් සහයෝගයෙන් ක්‍රියා කරන ලෙසටයි උන්වහන්සේ හිටපු ගරු සභාපතිතුමාගේ හත් දවසේ පිංකම සිදු කරන අවස්ථාවේදීත් අනුශාසනා කලේ.එම අනුශාසනාවන් පැත්තකට දාලා පාගලා තමා අපට මේ සභාවේ කටයුතු සිදු කිරීමට සිදු වන්නේ.

ගරු සභාපතිතුමණි, හිටපු ගරු සභාපතිතුමාගේ අභාවයෙන් පසු ඇති වූ මේ පුරප්පාඩුව පිරවීම කල යුත්තේ ප්‍රාදේශීය සභා පනතේ සඳහන් ආකාරයට, මේ උත්තරීතර ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඡන්දය ප්‍රකාශ කිරීම මතයි.අපට දැන ගන්න ලැබුනා හිටපු ගරු සභාපතිතුමා අයි.ඩී.එච්.රෝහලේ දැඩිසත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටින විට මේ මන්ත්‍රී කණ්ඩායම සභාපතිකම සඳහා තරඟ වැදුනා.එහෙම නින්දිත මන්ත්‍රී කණ්ඩායමක් තමා ඊයේ මේ රජයේ දේපලවලට ගිනි තියන්න උත්සහා කලේ.ඒකයි මේකේ තිබෙන යථාර්තය.

ඊයේ මම සභාවට පැමිණෙන විට ගරු උප සභාපතිතුමා ප්‍රමුඛ මේ මන්ත්‍රී කණ්ඩායම ගරු සභාපතිතුමා සමඟ සාකච්ඡාවක් තිබුණා.අපි දන්නැහැ මොකක් පිළිබඳවද?කියලා.අපි එයට සම්බන්ධ වුනෙත් නැහැ.ගරු සභාපතිතුමා සාකච්ඡාව අවසන් වෙලා තම අසුනට පැමිණි අවස්ථාවේ මමත් අපේ නන්දසිරි ගරු මන්ත්‍රීතුමාත් අපේ රාජකාරී කටයුත්ත ඉටුකර ගැනිමට ගරු සභාපතිතුමාත් සමඟ කථා කරමින් සිටින අවස්ථාවේ, ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා ඇවිත් ගරු සභාපතිතුමාට දිගින් දිගටම අභියෝග කලා.ඉන් පසු මා ප්‍රකාශ කලා ඔබතුමන්ලා ගරු සභාපතිතුමා සමඟ සාකච්ඡා කරලා යම් යම් තින්දු තීරණ ගන්න ඇති ඒවා ඒ ආකාරයට ක්‍රියාත්මක කරන්න,ගරු සභාපතිතුමා අපහසුතාවයට පත් කරන්න එපා කියලා ඉල්ලීමක් කලා.එය අසාගෙන එතන සරත්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාත් හිටියා.එතුමා ඒ අවස්ථාවේ මටත් දොස් පවරාගෙන එළියට ආවා.ඒ ඇවිත් තමා රජයේ දේපල විනාශ කර ගිනි තියන්න තැත් කලේ.

රත්මල්ල කොට්ඨාසයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂක තිලකරත්න මහතාටත් එම කොට්ඨාසය තුල යම් කිසි ඡන්ද සංඛ්‍යාවක් හිමි වුනා.පඩුවස්නුවර ආසනයේ කොට්ඨාස 22 ම සමස්ත ඡන්ද සංඛ්‍යාවේ එකතුවෙන් තමා අපට ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීන් 06ක් සහ ඡන්දයෙන් 01 අයෙකු පත් වුනේ.ඉතින් තිලකරත්න මහතාගේ ඡන්දත් මේ 06දෙනා පත් කර ගැනීම සඳහා එකතු වෙලා තිබෙනවා.ඔබතුමන්ලා එය පැහැදිලිවම තේරුම් ගන්න.ඔබතුමන්ලා කොට්ඨාස 18 දිනනකොට මේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරු ගැන දන් නැහැ.ඔබතුමන්ලාට මෙහි වටිනාකමක් නැහැ.

අපිට මතකයි හිටපු ගරු සභාපතිතුමාගේ කාලයේ මේ සභාව ආරම්භ කරනකොට අපිට මුලින්ම ඉදිකටුවෙන් තමා කෙනෙහෙළිකම් කරන්න පටන් ගත්තේ.අපි පුටු දෙන්න කතා කලා,ලේකම්තුමාගේ උපදෙස් අරගෙන කොමසාරිස්තුමා සමඟ සාකච්ඡා කරලා.මේ ජාතික ලැයිස්තුවෙන් ආ මන්ත්‍රීන් සියලු දෙනාටමත් පුටු ලබාදෙන්න කටයුතු කලා.ඒ නිසා ඔබතුමාලා මෙතන මැරිලා ඉපදුනා වගේ කතා කරන්න එපා.එහෙම කටයුතු කරන්න අපි ඉඩ දෙන්නෙත් නැහැ.ඔබතුමන්ලා මහජන නියෝජිතයෝ හැටියට ඔබතුමන්ලාගේ කාර්යභාරය තේරුම් ගන්න.ගරු සභාපතිතුමා තේරී පත්වුනේ ඡන්ද බලයෙන්.ඒ නිසා මෙතන ගරු සභාපතිතුමා මෙතුමායි,එය එතුමාගේ අයිතියක්.සාගර ගරු මන්ත්‍රීතුමා,ඔබතුමා තිලකරත්න මහතාගේ නිවස ඉදිරිපිටට විථි ලාම්පුවක් දාන්න හදනකොට ඉඩ දුන්නේ නැහැ.හිටපු ගරු සභාපතිතුමාට කියලා එය වැලැක්වූවා.රත්මල්ල කොට්ඨාසයේ තිලකරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කලා පාර හදලා දෙන්න කියලා.එතුමා සභාපති හැටියට එම කාර්යය කිරීම සඳහා එම ස්ථානයට මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය යවන්න කටයුතු කලා.ඔබතුමා ඊයේ විරුද්ධ වුනේ තිලකරත්න මහතාට නොවේ.රත්මල්ල කොට්ඨාසයේ ජීවත්වන ජනතාවට විරුද්ධවයි ක්‍රියා කලේ.මා එම ක්‍රියාව තරයේ හෙලා දකිනවා.ඒ එකක්.අපර්ණ ගරු මන්ත්‍රීතුමාටත් එසේ විරුද්ධ වුනා.ඒ නිසා මේ සභාවේ ගරු සභාපති හැටියට ඔබතුමා තීන්දු තීරණ ගැනිමේ දී ඍජුව ක්‍රියා කරන්න.කාටවත් ඕන විදිහට කටයුතු කරන්න එපා.ඒ වගේ ම ගරු සභාපතිතුමණි,මේ මාර්ග පද්ධතිය පසු ගිය කාලයේ ඇද හැලුණු වර්ෂාව නිසා ඉතාමත් අබලන් තත්ත්වයට පත් වෙලා.එම මාර්ග පද්ධතිය සංවර්ධනය කරන යෝජනා අරගෙන ඒවාට මුදල් ප්‍රතිපාදන වෙන් කරවාගෙන එම යෝජනා අතරින් සංවර්ධනය නොකරන ඒවා සහ සංවර්ධනය කෙරෙන ඒවා වෙන වෙනම දක්වන ලෙස ඉල්ලා සිටිමින් මා නැවතත් ඊයේ සිදු වූදේ නින්දිතව තරයේ හෙළා දකිනවා.ස්තුතියි.

**<u>සංශෝධන 02</u>**

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2021.12.14 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 09 හි **"අපනයන සැලසුම් ගම්මාන ව්‍යාපෘතිය සඳහා අපනයන සමාගමක් සහ මෙහෙයුම් හා ගබඩා පහසුකම් ලබා ගැනීම"** යන කරුණට අදාල වූ සභා තීරණය **"නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට සහ නිෂ්පාදන අවසානයේ එම නිෂ්පාදන අපනයනය කරන තෙක් ආරක්ෂිතව ගබඩා කර ගැනීමට අප සභාවට අයත් පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මාවී ඇළ ප්‍රදේශයේ ස්ථාපනය කර ඇති සතිපොළ ගොඩනැගිල්ල පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් නියම කරන ලද තක්සේරුවට අනුව කෙටි කාලීන බදු ක්‍රමයක් යටතේ (වර්ෂ 03 ක්) අ(ර්)ත් බවුන්ඩ් ක්‍රියේෂන්ස් සමාගම වෙත ලබාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය"** යනුවෙන් සංශෝධනය විය යුතුයි.එම සංශෝධනයත් සභා වාර්තාවට ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙස නිලධාරී මණ්ඩලයට දන්වා සිටිනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ඒ අනුව ඉහත සංශෝධන වලට යටත්ව 2021.12.14 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ඉහත සංශෝධන වලට යටත්ව 2021.12.14 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා විසින් 2021.12.14 දින මහා සභාවේ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රීවරුණි,සභාව සතු මාර්ග කටයුතු වල දී සභාවේ නිලධාරීන් හා සම්පත් යොදවා සභාව මඟින් සිදු කිරීම පිළිබඳව අදහස් දැක්වීමට මා බලාපොරොත්තු වෙනවා.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ විශේෂයෙන්ම මාර්ග සංවර්ධනයේ දී අපට විවිධ ආයතන වලින් ප්‍රතිපාදන ලැබෙනවා.ඒ සඳහා විවිධ ආයතන,විශේෂයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මැදිහත් වෙලා මේ කටයුතු කරනවා.ඇත්තටම මේවා සභාවේ මාර්ග.අපේ සභාවේ නිලධාරීන් හා සම්පත් යොදවනවා.මේවා අධීක්ෂණය කිරීමේ හා ඒ අවශ්‍ය කටයුතු සිදු ර දීමේ දී අපිට සුළු පරිපාලන වියදමක් පමණයි ලැබෙන්නේ.ඒ නිසා ප්‍රාදේශීය සභාව සතු සියලුම මාර්ග සඳහා ලැබෙන ප්‍රතිපාදන වලින් ප්‍රාදේශීය සභාවම මේ කටයුත්ත කල යුතුයි කියන නිවේදනය මම අද සභාව හමුවේ තබනවා.එතකොට අපිට අවශ්‍ය විදිහට අපේ අධීක්ෂණය යටතේ අපේ නිලධාරීන් යොදවලා ඒ මාර්ග සංවර්ධන කටයුතු සිදු කරන්න පුළුවන්.එහෙම නැතිනම් අපිට වෙන්නේ අපේ නිලධාරීන් ඒ ආයතන වලට ගිහින් කටයුතු කරන කොට ඒ නිලධාරීන්ගෙන් ලබා ගන්න තිබෙන සේවා කාලය අඩු වෙනවා.සභාව සතු මාර්ග ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අපේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යෑම තමයි මේකේ අරමුණ.ඒ වගේම මාර්ග හා සංවර්ධන කටයුතු වල දී ගැටලු කිහිපයක් ඇති වුණා පසුගිය දිනවල.ඒ නිසා මේ ප්‍රශ්නවලට පිළියමක් හැටියට,මේක පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ දේශපාලන ඉතිහාසය තුල සිදු නොවුණ දෙයක්.මේවා දැන් එනවා.ඒ එන එන ප්‍රශ්නවලට විසඳුම් හැටියට ගැලපෙන ආකාරයේ යම් යම් ප්‍රතිපාදන යොදන්න සිදු වෙනවා.ඒ නිසා මාර්ග සංවර්ධන කටයුතු වල දී ඉවත් කරන ලද කාණු කැට,ඉන්ටර්ලොක් ගල්,යකඩ ග්‍රේඩර් වගේ දේවල් අපි ඒ ඒ ස්ථානවලින් ඉවත් කරලා තැන් තැන් වල තබනවා.මේවා පසුගිය කාල සීමාව තුල කවදාවත් අපි මේ සභාවට ගෙනත් නෑ.නමුත් දැනට කොට්ඨාස දෙකක ඒ තත්ත්වය ඇති වී තිබෙනවා.ඒ නිසා ඉවත් කරන ලද කාණු කැට,ඉන්ටර්ලොක් ගල්,යකඩ ග්‍රේඩර් වගේ සභාව සතු සියලුම සම්පත් අපි සභාවට භාර ගන්න ඕන.එසේ නැතිනම් යකඩ ග්‍රේඩර් වගේ දේවල් මෙහෙට ප්‍රවාහනය කරන්න බෑ.අපි ඒ වගේ දේවල් පසුගිය කාලයේත් කලා. යකඩ ග්‍රේඩර් අපි ඒ ස්ථානවලම මිල ගණන් කැඳවලා ටෙන්ඩර් කරලා,නැතිනම් ඒවා වෙන්දේසි කරලා ඒ අවස්ථාවේම ඒවා ලබා දෙනවා.මේකේ දි අපි එක දෙයක් බලාපොරොත්තු වෙනවා.එකක් තමයි සභාවට ලැබෙන්න තිබෙන අපේ සම්පත්.මේවා සභාව සතු දේපල.අපේ සුළු සුළු මාර්ග වලට මේ ගලවන ලද ද්‍රව්‍ය අපිට දෙන්න පුළුවන්.අලුතෙන් කාණු කැටයක් දැම්මොත් එතන තිබුණ පරණ කාණු කැටය අපිට තවත් තැනකට දෙන්න පුළුවන්.මහුලාගම කොට්ඨාසයේ එහෙම ගැටළුවක් ආවා.අපි වහාම ඒ කාණු කැට ඉවත් කරලා සභාවට ගෙනාවා.පඩුවස්නුවර කොට්ඨාසයේ පහලගම.මාර්ගයක් හැදුවා.ඒ මාර්ගයේ ඉන්ටර්ලොක් ගල් අල්ලලා තිබුණේ.මට පැමිණිලි ගණනාවක් ආවා.සොයා බැලුවාම ඒ ගලවපු ඉන්ටර්ලොක් ගල් එක එක්කෙනා අරන්

ගිහින්.මේවා වැරදියි.ඒ නිසා මින් පසු මාර්ගයක් හදන්න පෙර අපේ කාර්මික නිලධාරී මහතාගේ අධීක්ෂණය යටතේ ඒකේ තිබෙන සම්පත් මොනවාද බලලා ඒවා අපි අපේ සභාවට භාර ගමු.
ඒ වගේම 2022 ජනවාරි 07 වන දින ලංකාදීප පුවත්පතේ වාර්තාව.ඒකේ සංශෝධනයක් තිබෙනවා.ඒකේ අර්ථය වෙනස් වෙලා තිබෙනවා.ඔබතුමන්ලා දකින්න ඇති මේ මන්ත්‍රීවරු කවුරු නැතත් මම ජනතාව වෙනුවෙන් වැඩ කරනවා.ඒක හරි.නමුත් මේක කීවේ මේ විදිහට නෙවෙයි.මාධ්‍යවේදී මහත්මියගෙන් මේක සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිනවා."**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් විරුද්ධ වුණත් පක්ෂය වෙනුවෙන් මා ජනතාව වෙනුවෙන් වැඩ කරනවා" යනුවෙන් නිවැරදි විය යුතුයි.**නැතිව අර විදියට ලිව්වොත් මේ ගරු මන්ත්‍රීවරු 38 දෙනාම නැතත් මම මේක කරනවා කියන අර්ථය තමයි මේකේ එන්නේ.අපේ පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු මට අයවැයට පක්ෂව ඡන්දය දුන්නේ නෑ.නමුත් ගරු මන්ත්‍රීවරු බහුතරය මට අයවැය සම්මත කරලා දුන්නා.මන්ත්‍රීවරු කිහිප දෙනෙක් විරුද්ධ වුණා.ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා අයවැයට විරුද්ධ වුණා.නමුත් මම බැඳිලා ඉන්නවා ඒ බහුතර මන්ත්‍රීවරුන් සමඟ බල ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය සේවය කරන්න.ඒ නිසා ඔබතුමිය ඒක නිවැරදි කරන්න.තව දෙයක් තිබෙනවා ඒ වාර්තාවේම."සභාවක සභාපතිවරයා පත් කිරීම පක්ෂ වලට කරන්න බෑ."එය නිවැරදි විය යුතුයි."**බහුතර බලයක් දිනා නොමැති සභා වලට සභාපතිවරයා පත් කිරීම පක්ෂ වලට පත් කල නොහැකිය"** යනුවෙන් එය සංශෝධනය විය යුතුයි.අපේ සභාව ගත්තාම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට බහුතර බලය නෑ.ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට මන්ත්‍රී ආසන 38 න් 18 යි තිබෙන්නේ.20ක් ඉන්නේ විපක්ෂයේ.අපේ සභාවේ සභාපතිවරයා පත් කිරීමේ නෛතික බලය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට නෑ.ඒ නිසා තමයි ඒ පනතේ කොන්දේසි අනුව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් මේ ස්ථානයේ දී නිලවරණයක් පවත්වලා නාම යෝජනා අරගෙන සභාපතිවරයා තෝරා පත් කර ගත්තේ.නමුත් 51% කට වඩා බහුතරය ලබා තිබෙන ප්‍රාදේශීය සභා වල ඕනෑම පක්ෂයකට ඒ සභාවේ සභාපතිවරයා තෝරා පත් කර ගන්න පුළුවන්.උදාහරණයක් හැටියට අලව්ව ප්‍රාදේශීය සභාවේ සන්ධ්‍යා රාජපක්ෂ ගරු සභාපතිතුමා කොවිඩ් රෝගය නිසා මිය ගියා.හැබැයි ඒ සභාවේ උප සභාපතිවරයා නෙවෙයි සභාපතිවරයා හැටියට පත් වුණේ.පද්මා වැත්තෑව මහත්මිය අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරිය ලෙස තේරී පත් වුණා.එතන 51% ට වැඩියි.මෙතන 51% ට අඩුයි.ඒ නිසා ඔබතුමිය මේ කතාවත් නිවැරදි කරන්න.නැතිනම් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට මේක වැරදි අර්ථකතනයක් දුන්නා හා සමානයි.
ඔබතුමන්ලා දන්නවා අපේ වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා රාජා කොල්ලුරේ මැතිතුමා කොවිඩ් රෝගය නිසා මිය ගියා.එතුමා ගැන පූර්ව ගුණකතනයක් අපි පසුගිය සභාවේ සිදු කලා.ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා ලෙස වසන්ත කරන්නාගොඩ මැතිතුමා පත් කරලා තිබෙනවා.එතුමාගේ පත් වීම පිළිබඳව අපේ සුභාශිංසන එක් කරමින්,වයඹ ජනතාවට දැවැන්ත සේවටක් ඉටු කිරීමට එතුමාට වාසනාව,ශක්තිය,ධෛර්යය ලැබේවා කියා ගරු මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් හා අපේ කාර්යය මණ්ඩලය වෙනුවෙන් අපි සුභාශිංසන එක් කරනවා.

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සංනිවේදන.

## I.නිවාඩු අනුමත කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද

මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.සචින්තා අමාලි මෙනවිය වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## II.අවධානම් දීමනාවක් ලබා ගැනීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පොල්තවාන ආදාහනාගාරයේ ගිවිසුම් පදනම මත සේවය කරන එම්.පී.ඩී.ජයන්ත මංජුල කුමාර යන අය හා ජේ.එම්.කැලුම් ඉන්දික කුමාර යන අය විසින් 2021.12.28 දාතමින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.එමගින් ඔවුන් දෛනික වැටුප් ලබන අතර සේවය ස්ථිර සේවයක් නොවන බවත්,රටේ පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කොරෝනා රෝගය වැළඳී මියගිය අයගේ ආදාහන කටයුතු ද සිදු කිරීමට සිදු වී ඇති බැවින් අවධානම් දීමනාවක් ලබා දෙන ලෙස ඉල්ලා තිබෙනවා.මෙය සාධාරණ ඉල්ලීමක්.ඒ සඳහා සභා සම්මුතියක් ලබා ගැනීමට යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා (එ.ජා.ප.)</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පොල්තවාන ආදාහනාගාරයේ ගිවිසුම් පදනම මත සේවය කරන එම්.පී.ඩී.ජයන්ත මංජුල කුමාර යන අය හා ජේ.එම්.කැලුම් ඉන්දික කුමාර යන අය විසින් ඉදිරිපත් කර තිබෙන්නේ සාධාරණ ඉල්ලීමක්.මාසයකට කිහිප වතාවක් මම ආදාහනාගාරයට යනවා.පසුගිය වර්ෂ දෙකකට අධික කාලය තුල කොරෝනා වසංගතය තුල ඉතා කැපවීමකින් මෙම සේවක මහතුන් දෙදෙනා රාජකාරි ඉටු කලා.කොරෝනා අවධානම ගැනවත් නොසලකා තමයි ඔවුන් කටයුතු කලේ.සමහර අවස්ථා වල රාත්‍රී 10.00 වන තුරු රාජකාරි ඉටු කල අවස්ථා තිබුණා.ඒ වගේම රටේ පවතින තත්ත්වය තුල ඔවුන්ගේ සේවය අහිමි වුණොත් ආදාහනාගාරය පවත්වාගෙන යාමට පුද්ගලයන් සොයා ගැනීමට අසීරුයි.ඒ නිසා ඔවුන් දිරි ගැන්වීමක් වශයෙන් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පොල්තවාන ආදාහනාගාරයේ ගිවිසුම් පදනම මත සේවය කරන එම්.පී.ඩී.ජයන්ත මංජුල කුමාර යන අය හා ජේ.එම්.කැලුම් ඉන්දික කුමාර යන අය වෙත එක් අයෙකුට මාසයකට රු.5000.00 බැගින් දිරි දීමනාවක් විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ලබා දීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>**

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පොල්තවාන ආදාහනාගාරයේ ගිවිසුම් පදනම මත සේවය කරන එම්.පී.ඩී.ජයන්ත මංජුල කුමාර යන අය හා ජේ.එම්.කැලුම් ඉන්දික කුමාර යන අයගේ සේවය දිරි ගැන්වීමක් වශයෙන් එම අය වෙත එක් අයෙකුට මාසයකට රු.5000.00 බැගින් දිරි දීමනාවක් විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ලබා දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පොල්තවාන ආදාහනාගාරයේ ගිවිසුම් පදනම මත සේවය කරන එම්.පී.ඩී.ජයන්ත මංජුල කුමාර යන අය හා ජේ.එම්.කැලුම් ඉන්දික කුමාර යන අයගේ සේවය දිරි ගැන්වීමක් වශයෙන් එම අය වෙත එක් අයෙකුට මාසයකට රු.5000.00 බැගින් දිරි දීමනාවක් විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ලබා දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පොල්තවාන ආදාහනාගාරයේ ගිවිසුම් පදනම මත සේවය කරන එම්.පී.ඩී.ජයන්ත මංජුල කුමාර යන අය හා ජේ.එම්.කැලුම් ඉන්දික කුමාර යන අයගේ සේවය දිරි ගැන්වීමක් වශයෙන් එම අය වෙත එක් අයෙකුට මාසයකට රු.5000.00 බැගින් දිරි දීමනාවක් විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ලබා දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## III.මාර්ග නම් කිරීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය විසින් මූණමල්දෙණිය කොට්ඨාසයේ ඇඹෝගෙදර ග්‍රාම නිලධාරී වසමේ මාර්ග දෙකක් ප්‍රදේශයේ මිය ගිය රණවිරුවන් දෙදෙනෙක් නමින් නම් කිරීමට ප්‍රදේශවාසී සියලු දෙනාගේ ඉල්ලීම පරිදි දොරටියාගෙදර සණස සමිතිය මඟින් ඉල්ලීමක් කර ඇති බවත්,ප්‍රදේශයේ විහාරස්ථානය ඇතුලු පොදු සංවිධාන වල සියලු දෙනා කැමැත්ත පල කර ඇති බවත් දන්වමින් සභාවට ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.එම කාරණය මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව ලබා දෙනවා.ඒ සඳහා සභා සම්මුතියක් ලබා ගැනීමට යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

හුණුපොලගෙදර විහාරස්ථානය අසල සිට හුණුපොලගෙදර මහ වැව දක්වා මාර්ගය රණවිරු ලාන්ස් කෝප්‍රල් එච්.එම්.චමින්ද උදයසිරි හේරත් යන නමින් ද , හුණුපොලගෙදර මහ වැව අසල සිට දොරටියාගෙදර උණගහවෙල මංසන්ධිය දක්වා මාර්ගය රණවිරු ලාන්ස් කෝප්‍ර එස්.එම්.සමන් කුමාර සෙනවිරත්න යන නමින් ද විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව නම් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

මූණමල්දෙණිය කොට්ඨාසයේ ඇඹෝගෙදර ග්‍රාමය තුල ජීවත් වූ ඉතාමත් අහිංසක පවුල් දෙකක දරුවෝ දෙදෙනෙක් පසුගිය වසර 30 ක යුද්ධය කාලයේ දී ජීවිතය පූජා කලා.මේ මාර්ග දෙක නම් කිරීම සඳහා මීට ඉහත අවස්ථා කිහිපයක දී ස්වේච්ඡා සංවිධාන කිහිපයකින්ම ඉල්ලීම් කර තිබුණා.නමුත් නිල වශයෙන් ඒක කර ගන්න අවස්ථාවක් ලැබී තිබුණේ නෑ.විශේෂයෙන්ම හුණුපොලගෙදර විහාරස්ථානය,දොරටියාගෙදර සණස සමිතිය,ඒ වගේම තරුණ සංවිධාන,කාන්තා සංවිධාන ඇතුලු සියලුම සංවිධාන වල පොදු ඉල්ලීමක් හැටියට ඉදිරිපත් කල යෝජනාවක් තමයි මේ යෝජනාව,මියගිය රණවිරුවන් දෙදෙනා වෙනුවෙන් මෙම මාර්ග දෙක නම් කිරීම.ඔබ සියලු දෙනාට,මහා සභාවට මේ යෝජනාව ඉදිරිපත් කලේ ගම්වාසීන්ගේ ඉල්ලීම අනුව ඒ සඳහා විශේෂ අනුමැතියක් ලබා ගැනීමටයි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

හුණුපොලගෙදර විහාරස්ථානය අසල සිට හුණුපොලගෙදර මහ වැව දක්වා මාර්ගය රණවිරු ලාන්ස් කෝප්‍රල් එච්.එම්.චමින්ද උදයසිරි හේරත් යන නමින් ද , හුණුපොලගෙදර මහ වැව අසල සිට දොරටියාගෙදර උණගහවෙල මංසන්ධිය දක්වා මාර්ගය රණවිරු ලාන්ස් කෝප්‍රල් එස්.එම්.සමන් කුමාර

සෙනවිරත්න යන නමින් ද විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව නම් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව හුණුපොලගෙදර විහාරස්ථානය අසල සිට හුණුපොලගෙදර මහ වැව දක්වා මාර්ගය රණවිරු ලාන්ස් කෝප්‍රල් එච්.එම්.චමින්ද උදයසිරි හේරත් යන නමින් ද , හුණුපොලගෙදර මහ වැව අසල සිට දොරටියාගෙදර උණගහවෙල මංසන්ධිය දක්වා මාර්ගය රණවිරු ලාන්ස් කෝප්‍රල් එස්.එම්.සමන් කුමාර සෙනවිරත්න යන නමින් ද විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව නම් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## IV. Re:Including relevant sub sections in the Municipal and Urban Councils Ordinance and Pradeshiya Sabha Act to improve quality of public health in urban sector.

ඉහත කරුණ සම්බන්ධයෙන් වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ අංක ව/පපාදෙ/03/06/01 හා 2022.01.05 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL/10/04/01/2021 (sub) සහ 2021.11.19 දිනැති ලිපිය මඟින්, සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක RAVE & UH/C/03/2021 සහ 2021.08.05 දිනැති ලිපිය හා ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් වන සංශෝධන යෝජනා ඇතුලත්ව ඉදිරිපත් කර ඇති ඇමුණුම ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

## 04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න-නැත

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා

## I. මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම , නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා කාරක සභාවක් පත් කිරීම

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022 වර්ෂය සඳහා පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම , නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාව සඳහා සාමාජිකයින් පත් කර ගත යුතුයි.ඒ සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයට අවස්ථාව ලබා දෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)**

සියලු දෙනාටම සුභ අලුත් අවුරුද්දක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම , නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 12 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා තුමියන්ලාගෙන් සැදුම්ලත් කාරක සභාවක් පත් කිරීමත්,එකී කාරක සභාව සඳහා මූල්‍ය සීමාව රුපියල් ලක්ෂ 20 දක්වා වූ සියලු ඇස්තමේන්තු අනුමත කිරීම,ගෙවීම,ගිවිසුම්ගත වීමට අදාල තීරණ ගැනීම,වාර්ෂික වත්කම් බදු දීම සහ පුවත්පත් දැන්වීම් මගින් කරනු ලබන ටෙන්ඩර් කැඳවීම් වලට අදාල නොවන්නා වූ සියලු මිල ගණන් කැඳවීමේ බලය සහ ඒ සඳහා ගෙවීම් කිරීමටද බලය පැවරීමත්,මෙම කමිටුව සෑම මසකටම දෙවතාවක් රැස්වීමත්,ගරු සභාපතිතුමා වෙත මෙම කමිටු ආවරණ අනුමැතියට යටත්ව රු.200,000.00 දක්වා වූ ගෙවීම් කිරීමට හා මිල ගණන් කැඳවීමට බලය පැවරීමත්,මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම,කාණු කැට ලබා දීම හා ශ්‍රමදාන වැඩසටහන් සඳහා ගරු සභාපතිතුමාට බලය පැවරීමත් සුදුසු බව මා යෝජනා කරනවා.තවද මෙම කාරක සභාව සඳහා රු.2,000,000.00 දක්වා සිදු කරන්නා වූ සියලු වැඩ විෂයන් සම්බන්ධ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ බලය ද,ගෙවීම් කටයුතු කිරීමේ බලය ද ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා.

01. ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා
02. ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
03. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - ( එ.ජා.ප.)
04. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)
05. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)
06. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - ( එ.ජා.ප.)

07. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)

08. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)

09. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)

10. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - ( එ.ජා.ප.)

11. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා - ( එ.ජා.ප.)

12. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)

13. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)

14. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)

15. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)

16. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල.මු.කො.)

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ඒ අනුව මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම , නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 12 (2) වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා තුමියන්ලාගෙන් සැදුම්ලත් කාරක සභාවක් පත් කිරීමත්,එකී කාරක සභාව සඳහා මූල්‍ය සීමාව රුපියල් ලක්ෂ 20 දක්වා වූ සියලු ඇස්තමේන්තු අනුමත කිරීම,ගෙවීම,ගිවිසුම්ගත වීමට අදාල තීරණ ගැනීම,වාර්ෂික වත්කම් බදු දීම සහ පුවත්පත් දැන්වීම් මගින් කරනු ලබන ටෙන්ඩර් කැඳවීම් වලට අදාල නොවන්නා වූ සියලු මිල ගණන් කැඳවීමේ බලය සහ ඒ සඳහා ගෙවීම් කිරීමටද බලය පැවරීමත්,මෙම කමිටුව සෑම මසකටම දෙවතාවක් රැස්වීමත්,ගරු සභාපතිතුමා වෙත මෙම කමිටු ආවරණ අනුමැතියට යටත්ව රු.200,000.00 දක්වා වූ ගෙවීම් කිරීමට හා මිල ගණන් කැඳවීමට බලය පැවරීමත්,මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම,කාණු කැට ලබා දීම හා ශ්‍රමදාන වැඩසටහන් සඳහා ගරු සභාපතිතුමාට බලය පැවරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව හා මෙම කාරක සභාව සඳහා රු.2,000,000.00 දක්වා සිදු කරන්නා වූ සියලු වැඩ විෂයන් සම්බන්ධ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ බලය ද,ගෙවීම් කටයුතු කිරීමේ බලය ද ලබා දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම , නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 12 (2) වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා තුමියන්ලාගෙන් සැදුම්ලත් කාරක සභාවක් පත් කිරීමත්,එකී කාරක සභාව සඳහා මූල්‍ය සීමාව රුපියල් ලක්ෂ 20 දක්වා වූ සියලු ඇස්තමේන්තු අනුමත කිරීම,ගෙවීම,ගිවිසුම්ගත වීමට අදාල තීරණ ගැනීම,වාර්ෂික වත්කම් බදු දීම සහ පුවත්පත් දැන්වීම් මගින් කරනු ලබන ටෙන්ඩර් කැඳවීම් වලට අදාල නොවන්නා වූ සියලු මිල ගණන් කැඳවීමේ බලය සහ ඒ සඳහා ගෙවීම් කිරීමටද බලය පැවරීමත්,මෙම කමිටුව සෑම මසකටම දෙවතාවක් රැස්වීමත්,ගරු සභාපතිතුමා වෙත මෙම කමිටු ආවරණ අනුමැතියට යටත්ව රු.200,000.00 දක්වා වූ ගෙවීම් කිරීමට හා මිල ගණන් කැඳවීමට බලය පැවරීමත්,මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම,කාණු කැට ලබා දීම හා ශ්‍රමදාන වැඩසටහන් සඳහා ගරු සභාපතිතුමාට බලය පැවරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව හා මෙම කාරක සභාව සඳහා රු.2,000,000.00 දක්වා සිදු කරන්නා වූ සියලු වැඩ විෂයන් සම්බන්ධ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ බලය ද,ගෙවීම් කටයුතු කිරීමේ බලය ද ලබා දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## II.අංක 3307 දරණ පිඹුරේ සඳහන් කට්ටි කරන ලද (සුනිල් ලෑන්ඩ් වත්ත) ලොට් අංක 13 දරණ අඩි 20 ක මාර්ගය පොදු මාර්ගයක් ලෙස භාවිතයට ඉඩ සලසා දෙන මෙන් යෝජනා කරමි.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

අංක 3307 දරණ පිඹුරේ සඳහන් කට්ටි කරන ලද (සුනිල් ලෑන්ඩ් වත්ත) ලොට් අංක 13 දරණ අඩි 20 ක මාර්ගය පොදු මාර්ගයක් ලෙස භාවිතයට ඉඩ සලසා දෙන මෙන් වන යෝජනාවක් ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා අද දින සභාවේ න්‍යාය පත්‍රය සඳහා ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව ඉදිරිපත් කිරීමට එතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා - (එ.ජා.ප.)**

අංක 3307 දරණ පිඹුරේ සඳහන් කට්ටි කරන ලද (සුනිල් ලෑන්ඩ් වත්ත) ලොට් අංක 13 දරණ අඩි 20 ක මාර්ගය පොදු මාර්ගයක් ලෙස භාවිතයට ඉඩ සලසා දීම සුදුසු බව මා යෝජනා කරනවා.මේක 1996 වර්ෂයේ විතර කට්ටි කල ඩමක්.අක්කර දෙකක පමණ භූමි ප්‍රමාණයක්.ඒකේ අංක 3307 දරණ පිඹුරේ සඳහන් කට්ටි කරන ලද (සුනිල් ලෑන්ඩ් වත්ත) ලොට් අංක 13 දරණ අඩි 20 ක මාර්ගය.ඒක අනවසරයෙන් වගේ අත්පත් කරගෙන තිබුණා.පසුව සභාව මැදිහත් වෙලා කම්බි කණු ගහලා මේක සභාවේ ඉඩමක් විදිහට පවත්වාගෙන යනවා කියලා දැනුම් දීලා තිබෙනවා.නමුත් මේක ප්ලෑන් එකේ පෙන්වන්නේ අඩි 20 ක මාර්ගයක් හැටියට.මේ පාරට එහා පැත්තේ ඉඩම් කට්ටි දෙකක් අරගත්ත පුද්ගලයෙක් තමයි මේ පාර නැවත වතාවක් ඉල්ලන්නේ.අඩි 15 ක පාරක් තිබෙනවා.නමුත් ලොකු වාහනයක් ගිහින් මේකේ හරවන්න බෑ.මමත් ඒ පාරේ ගිහින් බැලුවා.අඩි 20 ක පාර තමයි දැනට වහලා තිබෙන්නේ සභාවේ ඉඩමක් හැටියට.ඒක තමයි නැවත මාර්ගයක් ලෙසට ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් සභාවට යෝජනාවක් ඉදිරිපත් කලේ.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීතුමණි,මේ මාර්ගය බලන්න මමත් ගියා.ඔබතුමා කීව කාරණාත් තිබෙනවා.සභාව සතුව තිබෙන්නේ.ඒ නිසා ඔබතුමාගේ ඒ ඉල්ලීම ඉදිරි සභා වාරයකට කල් තියමු,ඒ වෙනකොට සමීක්ෂණයක් කරලා තීන්දුවක් ගන්න.එහෙම නැත්නම් අපි කමිටුවක් පත් කරලා කරුණු සොයා බලමු.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා -(එ.ජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමණි, ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා ගෙන ආ යෝජනාව අපි පිළිගන්න ඕන.ඒ වගේම ඔබතුමා කීවා ලබන සභා වාරයට කල් තියමු කියලා.මම යෝජනාවක් හැටියට ගේනවා අපි මේ සම්බන්ධව කමිටුවක් පත් කරලා ගිහින් බලලා මේ සම්බන්ධව තීන්දුවක් ගමු කියලා.ඇත්ත තත්ත්වය එතකොට පේනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>**

ගරු සභාපතිතුමණි,මේකේ පොඩි පැටලීමක් තිබෙනවා කියලා මම විශ්වාස කරනවා.අඩි 20 ක පාරක් පාර කඩන කොට මේ සභාව අනුමත කරලා තිබෙනවා නම්,ඊට පස්සේ ඒ පාර වහලා මේක සභාව සතුයි කියනවා නම් මම හිතන්නේ ඒක මේ සභාවේ තිබෙන නීති රීති වලට පටහැනියි.මොකද අක්කර දෙකක භූමි ප්‍රමාණයක් කඩන කොට සභාවට ඉඩමේ කොටසක් අයිති වෙනවාද නැද්ද කියන කාරණය මම නම් දන්නේ නෑ.එහෙම අයිති වෙන්නේ නෑ.එතකොට මේක අයිති වුණේ කොහොමද කියන කාරණය තිබෙනවා.අක්කර දෙකකට අඩු භූමි ප්‍රමාණයක සභාවට කොටසක් නෑ.හැබැයි පාර ඇරියා නම් පාර සභාවට.මීට පෙර සභාපතිවරු දෙදෙනෙකුට මේ සම්බන්ධයෙන් යෝජනා කරලා තිබෙනවා.නමුත් කිසිම ප්‍රගතියක් ලැබී නැතිව තමයි ඒ යම් පුද්ගලයෙක් මේක අල්ලගෙන ඉඳලා මේකේ නීත්‍යානුකූලභාවය ටික ටික හෙලි වීගෙන එනකොට ඒ පාර සභාවට අයිති ඉඩමක් හැටියට මේක අයිති වෙලා කියන කාරණය මම විශ්වාස කරනවා.මම හිතන්නේ සභාවට අයිති නැති,ඒ පුද්ගලයින් සතු ඉඩමක් සතු පාර සඳහා අපිට කමිටු පත් කරන්න ඕන නෑ.මම හිතන්නේ ලේකම්තුමාට කාරක සභාවක් බවට පත් කිරීමෙන් පසු පැහැදිලි කරන්න පුළුවන්.කොහොමද මේක සභාවට අයිති වෙන්නේ.මේකේ යම්කිසි බලපෑමක් කාගේ හෝ තිබෙනවා.කමිටු පත් කරන්න එපා.ඔබතුමා මේක ඊළඟ සභා වාරයට කල් දාන්න.මම විශ්වාස කරන හැටියට මේකේ යටින් යම් මොකක් හරි ක්‍රමවේදයක් තිබෙනවා.මේ පාර අනිවාර්යයෙන් මේ පුද්ගලයාට ලබා දිය යුතුයි.මොකද ඒ පුද්ගලයාට පාරක් අත්‍යාවශ්‍යයි.විකල්ප මාර්ග ඕන තරම් තිබෙනවා.ඒකයි මගේ අදහස.මේ ඉඩම සභාවට අයිති වීම පිළිබඳව මම ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා -(එ.ජ.නි.ස.)</u>**

මෙම ඉඩම තිබෙන්නේ කඩවලගෙර වසමේ.මේක කැබලි කල ඉඩමක්.මෙහි එකම ප්‍රමාණයට තමයි මාර්ග වෙන් කරලා තිබෙන්නේ.ගරු සභාපතිතුමණි,ඔබතුමත් නිරීක්ෂණය කරන්න ඇති,අපි කිහිප දෙනෙක් ගිහින් නිරීක්ෂණය කලා.එක ගෙදරකට තමයි පාර ඉල්ලන්නේ.නමුත් අනිත් පාරෙන් ඒ ගෙදරට යන්න පුළුවන්.කට්ටි කරද්දී දීලා තිබෙන්නේ ඉඩම් කැලි තුනකට ඔය පාර.කොලේ වහලා තමයි දීලා තිබෙන්නේ.ඔය කියන ඉඩමට තවත් විකල්ප මාර්ගයක් තිබෙනවා.වෙනත් ඉඩමක් ඒ පාරේ නෑ.සානුකම්පිතව සාධාරණව බලන කොට සභාව සතු මාර්ගයක් ලෙස වෙන් කරලා තිබෙනවා.ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා කීවා වගේ කමිටුවක් පත් කරලා කටයුතු කලොත් සාධාරණය සියලු දෙනාටම ලැබෙයි.එක ගෙදරකට පාරක් සභාව සතු කොටසෙන් දෙනවාට වඩා මම හිතන්නේ අපි සියලුම මහජන නියෝජිතයෝ,අපේ කාලයේ මහජනතාව කාටවත් අසාධාරණයක් වෙන්නේ නැතිව අපි සියලු දෙනා

වගකීම් සහිත මන්ත්‍රීවරු විදිහට ඒ ස්ථානයට ගිහින් ස්ථානීය පරීක්ෂණයක් කරලා සොයා බලා කටයුතු කරනවා නම් හොඳයි.මොකද මේ මාර්ගය වෙන් කලා කියලා කාටවත් මේකෙන් අවාසියක් වෙන්නේත් නෑ.වාසියක් වෙන්නේත් නෑ.මොකද ඔය කියන ඉඩමේ පිටුපසට පාරක් තිබෙනවා.නැවත සභාවට වෙන් කරලා තිබෙන කොටසෙන් පාරක් වෙන් කලා කියලා වෙනසක් වෙන්නේ නෑ.ඔබතුමාත් එතන ස්ථානීය පරීක්ෂණයක් කලා නම් මොකක්ද මේකේ තිබෙන ප්‍රශ්නය කියලා ඔබතුමාට වැටහෙයි.ඒ නිසා අපි සියලු දෙනාම එකතු වෙලා කාටවත් අසාධාරණයක් වෙන්නේ නැතිව මේ සම්බන්ධව කටයුතු කරමු.මොකද බෙදපු කෙනාගේ තමයි මේකේ වරද තිබෙන්නේ.ඒ නිසා මේක සභාව සතු ඉඩමක් විදිහට වෙන් කර ගත්තේ කොහොමද හොයනවාට වඩා ගිහින් බලලා පරීක්ෂා කරලා සාධාරණව සුදුසු කටයුතු කරන්න පියවර ගත්තොත් හොඳයි.අපේ මන්ත්‍රීතුමන්ලාගේ කමිටුවක් පත් කරලා ඒ පිළිබඳව සොයා බලන ලෙස ඉල්ලීමක් කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>**

ගරු සභාපතිතුමණි,ඔය අක්කර දෙකක භූමි ප්‍රමාණය පර්චස් 15 කට හෝ 20 කටනේ කඩන්න ඇත්තේ.ඒ ඉඩමට තව කොටස්කරුවන් හතර පස් දෙනෙක් හිටියා නම් ඔය පාර අනිවාර්යයෙන් ඕනනේ.සභාවේ අපේ කාර්මික නිළධාරී මහත්වරු ගිහින්නේ පාරවල් වෙන් කරලා තිබෙන්නේ.පාරවල් වෙන් කරලා දුන්නාට පස්සේ සමහර විට කොටස් වශයෙන් කඩන්න ඇති.ඊට පස්සේ එක පුද්ගලයෙක් මේක ගන්න ඇති.සමහර විට තව ටික කාලෙකින් ඔය මනුස්සයා ඕකෙන් කොටසක් විකුණුවොත් ඒ මනුස්සයා නැවත වහපු පාර කොහොමද ලබා ගන්නේ.එතකොට අර මනුස්සයාට ඉදිරියට තිබෙන පාර නැතිව විකල්ප මාර්ගයක් පිටුපසට දීලා තිබෙනවා.ඒ වගේම මේක අපිට අයිති නැති භූමියක්.අපේ සභාව නීති උල්ලංඝනය කරනවා.අපි බලෙන් මේක අරගෙන තිබෙන්නේ.ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා කොළේ වහලා දුන්න කතාවක් කියනවා.එහෙම බෑ.එහෙනම් මෙතන මොකක් හරි ලොකු වංචාවක් තිබෙනවා.ඒ නිසා ඔබතුමා මේකට කමිටුවක් පත් කරන්න,කමක් නෑ.නමුත් සභාවට අයිති නැති දෙයක් පිළිබඳව තමයි අපි මේ කතා කරන්නේ.සමහර විට ඔය ඉඩමේ පවුල් කිහිපයක් පදිංචි වෙන්න පුළුවන්.ප්ලෑන් එකේ තිබෙනවා පාර.ඉදිරි අනාගතේ ලොකු අවාසියක් වෙන්න පුළුවන්.අපි ඉදිරිය ගැන හිතන්න ඕන.ඒ නිසා සභාවක් හැටියට අපේ වගකීම.එතුමාගේ යෝජනාව පිළිබඳව මීට වඩා ඔබතුමාලා අධ්‍යයනය කරලා කටයුතු කරන්න.මගේ දැඩි විරෝධය පල කරනවා.ඒ පාර විවෘත කරලා තිබෙන විදිහටම කම්බි ගහලා ජනතාවට අවශ්‍ය දේ ඉදිරියේ දී ගන්න පුළුවන් ආකාරයට ඉඩ සලසන එක තමයි මහජන නියෝජිතයින් හැටියට අපේ යුතුකම.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය පෙ.ව.11.12 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**<u>ප්‍රාදේශීය ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා (එ.ජා.ප.)</u>**

ගරු සභාපතිතුමා,මේ ප්‍රශ්නය අද ඇති වුණ එකක් නෙවෙයි.මට හොඳට මතකයි මේ ප්‍රශ්නය මීට පෙර සභාපතිවරු දෙදෙනෙක් යටතේ ආවා.හැබැයි මේ පිළිබඳව ලොකු දැනුමක් ලේකම්තුමාට තිබෙනවා.අපි මේක අහගෙන ඉන්නවා විතරයි.අපි මේ කියන තැන දන්නේත් නෑ.එම නිසා මේ සම්බන්ධව දැනුවත් වීම සඳහා මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ප්‍රාදේශීය ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා (එ.ජා.ප.)</u>**

මෙම කාරක සභා අවස්ථාව නැවත මහා සභා අවස්ථාව බවට පත් කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා -(එ.ජ.නි.ස.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ප්‍රාදේශීය ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා (එ.ජා.ප.)</u>**

අංක 3307 දරණ පිඹුරේ සඳහන් කට්ටි කරන ලද (සුනිල් ලෑන්ඩ් වත්ත) ලොට් අංක 13 දරණ අඩි 20 ක මාර්ගය පොදු මාර්ගයක් ලෙස භාවිතයට ඉඩ සලසා දෙන මෙන් ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා -(එ.ජ.නි.ස.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

අංක 3307 දරණ පිඹුරේ සඳහන් කට්ටි කරන ලද (සුනිල් ලෑන්ඩ් වත්ත) ලොට් අංක 13 දරණ අඩි 20 ක මාර්ගය පොදු මාර්ගයක් ලෙස භාවිතයට ඉඩ සලසා දෙන මෙන් ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව අංක 3307 දරණ පිඹුරේ සඳහන් කට්ටි කරන ලද (සුනිල් ලෑන්ඩ් වත්ත) ලොට් අංක 13 දරණ අඩි 20 ක මාර්ගය පොදු මාර්ගයක් ලෙස භාවිතයට ඉඩ සලසා දෙන මෙන් ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## 06.කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.

## I.2021.12.09 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2021.12.09 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සහා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.ගරු මන්ත්‍රීවරුණි,මේ මුදල් කමිටු වාර්තා කියවන්න.ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීවරු බොහෝම අසාධාරණ විදිහට මට චෝදනා කරනවා.මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට මම සම්පත් බෙදලා දෙන්නේ නෑ කියලා.ඒ මුදල් කමිටු වාර්තාව බලන්න.සියලු මන්ත්‍රීවරුන්ට සාධාරණව සම්පත් බෙදා දීලා තිබෙනවා.සමහර මන්ත්‍රීවරුන්ට දෙන්න පුළුවන් උපරිමයෙන් දීලා තිබෙනවා.අද ජනවාරි 11.මේ දවස් 11 ට මට ප්‍රාතිහාර්යයක් පාන්න බෑ.අද උදේත් මහත්මයෙක් ඇවිත් මෝටර් ග්‍රේඩරයක් කුලියට ගන්න ඇහුවා.මම කීවා දෙන්න විදිහක් නෑ,මේ මන්ත්‍රීවරුන්ට වෙන් කරලා තිබෙන දිනයක් තමයි දෙනවා නම් දෙන්න වෙන්නේ කීවා.පසුගිය වර්ෂාවත් එක්ක අපේ පාරවල් ඉතාම දුර්වල මට්ටමේ තිබෙන්නේ.මම මොනවත් දෙන්නේ නෑ කියලා මට චෝදනා කරන ගරු මන්ත්‍රීවරු පිරිසක් ඉන්නවානේ.බොරළු කපා ගන්න මුදල් ඉල්ලුවා. ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතාට,ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතාට මම ඒවා දුන්නා.ගරු මන්ත්‍රීවරුන්ට පක්ෂ භේදයකින් තොරව මම සම්පත් දීලා තිබෙනවා.කාටවත් මම අසාධාරණයක් කරන්නේ නෑ.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2021.12.09 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2021.12.09 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2021.12.09 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2021.12.09 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව**

**සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## II.2021.12.23 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2021.12.09 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සහා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**</u>

2021.12.23 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)**</u>

2021.12.23 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2021.12.23 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2021.12.23 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා පෙ.ව.11.30 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.

**I. 2021 දෙසැම්බර් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය)**

**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 01

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 2209877.50 | 1329995.97 | 1323940.14 | 37440.00 | 205269.49 | 1727076.04 | 6833599.14 |
| 2 | ගමන් වියදම් | 77040.00 | 0.00 | 21800.00 | 0.00 | 0.00 | 0.00 | 98840.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 564705.00 | 956252.10 | 564502.00 | 145300.00 | 54070.00 | 57026.00 | 2341855.10 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 421179.00 | 223087.00 | 248916.00 | 19500.00 | 34250.00 | 24240.00 | 971172.00 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 175421.15 | 223587.26 | 45600.00 | 419614.34 | 24075.60 | 47666.40 | 935964.75 |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 44321.79 | 0.00 | 36611.83 | 0.00 | 80933.62 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 20440.00 | 89250.00 | 0.00 | 0.00 | 0.00 | 260175.00 | 369865.00 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 37236.18 | 39752.35 | 0.00 | 0.00 | 0.00 | 13603.95 | 90592.48 |
| | **පුනරාවර්ථන වැය එකතුව** | **3505898.83** | **2861924.68** | **2249079.93** | **621854.34** | **354276.92** | **2129787.39** | **11722822.09** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 163700.00 | 85800.00 | 6142129.44 | 0.00 | 0.00 | 2994275.00 | 9385904.44 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 249679.00 | 0.00 | 528379.61 | 0.00 | 778058.61 |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **163700.00** | **85800.00** | **6391808.44** | **0.00** | **528379.61** | **2994275.00** | **10163963.05** |
| | **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතුව** | **3669598.83** | **2947724.68** | **8640888.37** | **621854.34** | **882656.53** | **5124062.39** | **21886785.14** |
| | තැන්පත් | 1103284.01 | | | | | | 1103284.01 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 0.00 | | | | | | 0.00 |
| | සේවක ණය | 175008.00 | | | | | | 175008.00 |
| | අත්තිකාරම් | 0.00 | | | | | | 0.00 |
| | ණයහිමි | 0.00 | | | | | | 0.00 |
| | සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| | ආයෝජන | 1586238.00 | | | | | | 1586238.00 |
| | අගරු චෙක් | 7580.00 | | | | | | 7580.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **2872110.01** | | | | | | **24758895.15** |

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**
2021 දෙසැම්බර් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.
**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල.මු.කො.)</u>**
2021 දෙසැම්බර් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.
**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2021 දෙසැම්බර් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.
**ඒ අනුව 2021 දෙසැම්බර් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## II. 2021 දෙසැම්බර් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය)

**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 02

| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 55308.43 | 81000.00 | - | - | - | 0.00 | 136308.43 |
| 20 කුලී | - | - | 837839.58 | - | 818013.86 | 10000.00 | 1665853.44 |
| 30 බලපත්‍ර ගාස්තු | 0.00 | 64500.00 | - | - | - | 0.00 | 64500.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 59000.00 | 490099.00 | 430600.22 | 44527.25 | - | 14895.00 | 1039121.47 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 0.00 | 0.00 | 17589.46 | 0.00 | 750.00 | 2162.25 | 20501.71 |
| 60 වෙනත් ආදායම් | 34949.36 | 43190.00 | 0.00 | 916780.58 | 66285.00 | 75.00 | 1061279.94 |
| 70වෙනත් ආධාර | 2503615.00 | 527150.00 | 1387900.00 | 37440.00 | 122460.00 | 1557579.80 | 6136144.80 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **2652872.79** | **1205939.00** | **2673929.26** | **998747.83** | **1007508.86** | **1584712.05** | **10123709.79** |
| **ප්‍රාග්ධන ආධාර** | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 1446561.49 | 0.00 | 0.00 | 0.00 | 1446561.49 |
| **පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **2652872.79** | **1205939.00** | **4120490.75** | **998747.83** | **1007508.86** | **1584712.05** | **11570271.28** |
| තැන්පත් | 1487869.69 | | | | | | 1487869.69 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 41188.70 | | | | | | 41188.70 |
| සේවක ණය | 452469.50 | | | | | | 452469.50 |
| අත්තිකාරම් | 9000.00 | | | | | | 9000.00 |
| ණය ගැති | 29147.00 | | | | | | 29147.00 |
| සමු: අරමුදල | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 7580.00 | | | | | | 7580.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 15114.70 | | | | | | 15114.70 |
| **මුළු එකතුව** | **2042369.59** | | | | | | **13612640.87** |

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2021 දෙසැම්බර් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල.මු.කො.)</u>**

2021 දෙසැම්බර් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2021 දෙසැම්බර් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2021 දෙසැම්බර් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## III. 2021 දෙසැම්බර් මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව)

**උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 03

| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය<br>1 | මාසය මුලදී ඉදිරියට ලැබීම්<br>2 | මාසය තුළ බිල් කිරීම්<br>3 | ලැබිය යුතු මුළු ආදායම<br>4<br>(1+3) | මාසය තුළ ලද ආදායම<br>5 | මාසයට අදාල කලින් ලැබූ ආදායම<br>6 | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම<br>7<br>( 2-6) | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම<br>8 | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය<br>9 | ඉදිරියට ගෙන යන හිඟය<br>10<br>4 - (5+6) | ඉදිරියට ලැබීම්<br>11<br>(7+8) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වරිපනම් බදු 1/11 | 154641.45 | 472857.78 | 426645.85 | 581287.30 | 161536.46 | 433089.86 | 39767.92 | 60672.37 | 1782.70 | 44379.67 | 100440.29 |
| 2 | අක්කර බදු 1/12 | 28859.59 | 2470.00 | 7108.25 | 35967.84 | 15417.66 | 1330.00 | 1140.00 | 3472.66 | 5177.34 | 17515.50 | 4615.66 |
| 3 | කඩ කුලී 3/22 | 405035.49 | 234354.54 | 697250.00 | 1102285.49 | 588623.45 | 214157.76 | 21196.81 | 12867.31 | 5683.87 | 312371.62 | 34064.15 |
| 4 | වත්කම් බදු 5/23 | 4602588.19 | 2083.00 | 2083.00 | 4604671.19 | 242493.86 | 2083.00 | 0.00 | 0.00 | 0.00 | 4360094.33 | 0.00 |
| 5 | ජල ගාස්තු 4/62 | 1193342.67 | 49949.67 | 417669.00 | 1611011.67 | 911341.58 | 11580.04 | 38369.63 | 32350.75 | 16563.00 | 703877.80 | 70720.38 |
| 6 | ව්‍යාපාර බදු 2/16 | 0.00 | 0.00 | 78000.00 | 78000.00 | 78000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/14 | 0.00 | 0.00 | 3000.00 | 3000.00 | 3000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 64500.00 | 64500.00 | 64500.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | විශේෂ බලපත්‍ර ගාස්තු2/34 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | එකතුව | 6384467.39 | 761714.99 | 1696256.10 | 8080723.49 | 2064913.01 | 662240.66 | 100474.36 | 109363.09 | 29206.91 | 5438238.92 | 209840.48 |

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2021 දෙසැම්බර් මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල.මු.කො.)</u>**

2021 දෙසැම්බර් මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2021 දෙසැම්බර් මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2021 දෙසැම්බර් මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## IV. 2022 පෙබරවාරි මාසික ආදායම් පුරෝකථන වාර්තාව

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න.**

# උපලේඛන 04

| ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව | | | මාසික ආදායම් පුරෝකථන | | | අය වී ඇති ආදායම 2021 දෙසැම්බර්. | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අය - වැය ලේඛනය අනුව (1) | පරිපූරක මඟින් (2) | එකතුව3(1+2) | පෙර මාසය දක්වා (4) | මාසය තුළ(5) | එකතුව6(4+5) | පෙර මාසය දක්වා (7) | මාසය තුළ (8) | එකතුව 9(7+8) |
| වරිපනම් ( 1/11) | 1785000 | 0 | 1785000 | 206000 | 119000 | 325000 | 3234930.37 | 44528.56 | 3279458.93 |
| අක්කර බදු ( 1/12 ) | 50000 | 0 | 50000 | 5000 | 5000 | 10000 | 26108 | 17680 | 43788 |
| කසල බදු(2/13) | 1000 | 0 | 1000 | 100 | 100 | 200 | 0 | 0 | 0 |
| කර්මාන්ත බදු(2/16/i) | 50000 | 0 | 50000 | 15000 | 15000 | 30000 | 64500 | 3000 | 67500 |
| ඇතැම් ව්‍යාපාර බදු(2/16/iii) | 1000 | 0 | 1000 | 500 | 250 | 750 | 0 | 0 | 0 |
| ව්‍යාපාර බදු ( 2/16/ii ) | 2000000 | 0 | 2000000 | 800000 | 700000 | 1500000 | 2647400 | 78000 | 2725400 |
| බලපත්‍ර ගාස්තු ( 2/31/i ) | 1400000 | 0 | 1400000 | 500000 | 450000 | 950000 | 2308039.08 | 64500 | 2372539.08 |
| විශේෂ බල:ගාස්තු(2/31/ii) | 125000 | 0 | 125000 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| කඩ කුලී ( 3/22 ) | 8350800 | 0 | 8350800 | 695900 | 695900 | 1391800 | 12799210.6 | 588623 | 13387833.6 |
| ජංගම අලෙවි කුටි( 3/22-i) | 297000 | 0 | 297000 | 99000 | 99000 | 198000 | 264650 | 0 | 264650 |
| රථගාල් ගාස්තු(3/43/3) | 300000 | 0 | 300000 | 30000 | 25000 | 55000 | 309200 | 12000 | 321200 |
| ජල ගාස්තු(4/62,64) | 5800000 | 0 | 5800000 | 483000 | 483000 | 966000 | 7563965.38 | 927904.58 | 8491869.96 |
| සතිපොල බදු ( 5/22 ) | 8470000 | 0 | 8470000 | 720000 | 724000 | 1444000 | 10902182 | 116450 | 11018632 |
| බදු කුලී ( 5/23 ) | 8214535 | 0 | 8214535 | 0 | 821455 | 821455 | 11968852.5 | 242493.86 | 12211346.3 |
| විනෝද බදු ( 6/15 ) | 400000 | 0 | 400000 | 27500 | 27500 | 55000 | 24750 | 0 | 24750 |
| ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/2) | 160000 | 0 | 160000 | 11000 | 11000 | 22000 | 61500 | 0 | 61500 |
| එකතුව | 38889943 | 0 | 38889943 | 3593000 | 4176205 | 7769205 | 389912876 | 2095180 | 392008056 |

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**
2022 පෙබරවාරි මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල.මු.කො.)</u>**
2022 පෙබරවාරි මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 පෙබරවාරි මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.
**ඒ අනුව 2022 පෙබරවාරි මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## V. 2022 ජනවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව.

**උපලේඛන 05 සඳහා අනිත් පිට බලන්න.**

# උපලේඛන 05

| අනු අංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 93270132.00 | | 93270132.00 | | 7772511.00 | 7772511.00 | | 7060000.00 | 7060000.00 | 712511.00 |
| 2 | ගමන් වියදම් | 1064000.00 | | 1064000.00 | | 65000.00 | 65000.00 | | 50000.00 | 50000.00 | 15000.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 12263000.00 | | 12263000.00 | | 400000.00 | 400000.00 | | 375000.00 | 375000.00 | 25000.00 |
| 4 | ප්‍රග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 14040000.00 | | 14040000.00 | | 1800000.00 | 1800000.00 | | 1750000.00 | 1750000.00 | 50000.00 |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 11474000.00 | | 11474000.00 | | 1000000.00 | 1000000.00 | | 90000.00 | 90000.00 | 910000.00 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | 167360.00 | | 167360.00 | | 8000.00 | 8000.00 | | 8000.00 | 8000.00 | 0.00 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 6138000.00 | | 6138000.00 | | 280000.00 | 280000.00 | | 275000.00 | 275000.00 | 5000.00 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 968040.00 | | 968040.00 | | 65000.00 | 65000.00 | | 60000.00 | 60000.00 | 5000.00 |
| 9 | උපකරණ වැය | 34425000.00 | | 34425000.00 | | 3000000.00 | 3000000.00 | | 150000.00 | 150000.00 | 2850000.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | 2196000.00 | | 2196000.00 | | 38500.00 | 38500.00 | | 30000.00 | 30000.00 | 8500.00 |
| | එකතුව | 176005532.00 | | 176005532.00 | | 14429011.00 | 14429011.00 | | 9848000.00 | 9848000.00 | 4581011.00 |

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**
2022 ජනවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.
**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල.මු.කො.)</u>**
2022 ජනවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.
**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
2022 ජනවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.
**ඒ අනුව 2022 ජනවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## 08.රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට.

## I.කෙවිටිය කොට්ඨාසයේ පාසල් සම්බන්ධව.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
කෙවිටිය කොට්ඨාසයේ පාසල් සම්බන්ධව වෙනත් කරුණු යටතේ අදහස් ඉදිරිපත් කිරීමට ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා විසින් මා වෙත ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.ඒ සඳහා අවස්ථාවක් ලබා දෙනවා.
**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා - (එ.ජා.ප.)</u>**
පඩුවස්නුවර බටහිර කෙවිටිය කොට්ඨාසයේ තිබෙන උඩගම කණිෂ්ඨ විද්‍යාලය හා පෝරවැව කණිෂ්ඨ විද්‍යාලය වන පාසල් දෙක වැසී යාමට ඉඩ නොදී එම පාසල් දෙකේ පළමු ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණිය දක්වා ප්‍රදේශයේ සිටින පාසල් ළමුන් අධ්‍යාපන කටයුතු සඳහා යොමු කිරීමට අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම සුදුසු බව මා යෝජනා කරනවා. ගරු සභාපතිතුමණි, මේ පාසල් දෙක වැහෙන්න තමයි ගියේ.ඒ වැහෙන්න යන අතරේ හිටපු විදුහල්පතිවරු දෙපල මාරු උනා.නැවත විදුහල්පතිවරු පාසල් වලට පැමිණ සිටිනවා.දැන් පාසල් දෙක හොඳ තත්ත්වයක තිබෙනවා.ඒ කොට්ඨාසයේ ගම්වල ඉන්නේ ඉතාමත් දුප්පත් මිනිස්සු.මුදල් තිබෙන යමක් කර ගන්න පුළුවන් අය හෙට්ටිපොලට ළමයි ටික අරගෙන එනවා.නමුත් පහේ පන්තිය දක්වා ඒ පාසල් දෙකට ප්‍රදේශයේ සිටින ළමයි ටික යොමු කරන්න කියලා තමයි යෝජනා කරන්නේ.එහෙම නැති උනොත් මේ පාසල් වහන්න වෙනවා. ඒ නිසා ඒ ළමයින්ට පහේ පන්තියට යනකම් ඉගෙන ගත්තාට පසුව නගරයට එන්න අවස්ථාව ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.
**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>**
එම යෝජනාව මා ස්ථිර කරනවා.
**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
පඩුවස්නුවර බටහිර කෙවිටිය කොට්ඨාසයේ තිබෙන උඩගම කණිෂ්ඨ විද්‍යාලය හා පෝරවැව කණිෂ්ඨ විද්‍යාලය වන පාසල් දෙක වැසී යාමට ඉඩ නොදී එම පාසල් දෙකේ පළමු ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණිය දක්වා ප්‍රදේශයේ සිටින පාසල් ළමුන් අධ්‍යාපන කටයුතු සඳහා යොමු කිරීමට අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර බටහිර කෙවිටිය කොට්ඨාසයේ තිබෙන උඩගම කණිෂ්ඨ විද්‍යාලය හා පෝරවැව කණිෂ්ඨ විද්‍යාලය වන පාසල් දෙක වැසී යාමට ඉඩ නොදී එම පාසල් දෙකේ පළමු ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණිය දක්වා ප්‍රදේශයේ සිටින පාසල් ළමුන් අධ්‍යාපන කටයුතු සඳහා යොමු කිරීමට අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා - (එ.ජා.ප.)</u>**
ගරු සභාපතිතුමණි,පසුගිය සතියේ මම පොලට ආවා.ලක්ෂ ගණනකට යනවා හරක් මස් කඩේ.හරක් මස් කිලෝ එක රු.1200.00 යි.සභාවට මේක වෙනස් කරන්න පුළුවන්ද බැරිද මම දන්නේ නෑ.හැබැයි අහිංසක මිනිස්සු කුලී වැඩක් කරලා පොලට එන්නේ බඩු ටිකක් අරගෙන යන්න.මේක ලක්ෂ ගාණකට අරගෙන ජනතාවගෙන් අසාධාරණ ලෙස අය කරන්න එපා කියලායි අපි කියන්නේ.කුලියාපිටිය නගර සභාවේ යනවා යම් මිලක්.එම මිල මෙහෙත් විය යුතුයි.මොකද ජනතාව ගසා කනවා නම් ඒක හරි අසාධාරණයි.ඒ පිළිබඳවත් ඔබතුමාට මතක් කරනවා.මොකද මස් කඩ මාළු කඩවල ලොකු ගණන්වලට තමයි විකිණෙන්නේ.
ඒ වගේම ඔබතුමා කතා කලා පාරවල් සම්බන්ධව.මේ වන විට කෝටි ගණනක් ගමට ආව මුදල් ආපසු ගිහින් තිබෙනවා.ඔබතුමා මේ පාරවල් ටික හදන්න.දේශපාලන අධිකාරියෙන් ඉල්ලපුවාම යම්කිසි බලපෑමක් හෝ කුමක්

හෝ කාරණයක් නිසා ඒ පාරවල් වල මුදල් ආපසු ගියා.අපේ පන්සල් පාරේ ලක්ෂ 10 ක් ආපසු ගිහින් තිබෙනවා.කෙවිටිය කොට්ඨාසයේ කෝටියක් කිට්ටු වෙන්න මුදල් ආපසු ගිහින් තිබෙනවා.මේකේ සෞභාග්‍යයේ දැක්මක් නම් අපිට පේන්නේ නෑ.මොකද සෞභාග්‍යයේ දැක්ම නම් ගමට එන සල්ලි ගමේ ඉන්න ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඔය එළියේ කන්න නැතිව මාරාන්තික උපවාස කරන්න නෙවෙයි තිබෙන්නේ.මේ සල්ලි ටික ගන්න ජනතාව වෙනුවෙන්.අපි දැක්කා ස්වාමීන් වහන්සේ නමක් ඇවිත් ආප්ප කවනවා.මාරාන්තික උපවාසවල කෑම කන්නේ නෑනේ. ස්වාමීන් වහන්සේලා උපදෙස් දෙන්න ඕන මේ මන්ත්‍රීවරුන්ට.පක්ෂවලින් අපිට වැඩක් නෑ.අපිට ඕන ගමේ ජනතාවට වැඩ කරන්නයි.ඒ නිසා සංවිධායකතුමා ඇතුලු වියත් මගේ සංවිධායකවරු ගැන අපි කණගාටු වෙනවා.ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.ඔබතුමා සභාවෙන් මේවා සෘජු ඉදිකිරීම් යටතේ සිදු කරන්න ගත්තා.මන්ත්‍රීවරුන්ට කොමිස් එන්නේ නැති නිසා වෙන්න ඇති මේ මුදල් ආපසු යැව්වේ.ජනතාවට ආදරේනම් සභාවට ඇවිත් මේවා කතා කරන්න ඕන.බොහෝම අමාරුවෙන් මේ දවස්වල ජීවත් වෙන්නේ.එක ගෙදර ළමයි හතර පස් දෙනා ඉන්න ගෙවල් තිබෙනවා.උදේට බත් මුල් පහක් බදින්න ඕන.මිරිස් කරලක් රුපියල් විස්සක් විසි පහක් වෙනවා.සෞභාග්‍යයේ දැක්මද මේක.ගෑස් සිලින්ඩරයක් නෑ.එවැනි තත්ත්වයක් තිබෙන්නේ.ගමේ මිනිස්සු අහිංසකයි.ඒ වගේම මේ වන විට හිඟුරේගම ග්‍රාම සේවා වසමේ බෙන්ඩ්‍රික්වත්තේ ගොවි සමිතියකින් පාරක් කොන්ත්‍රාත් අරගෙන කරනවා.අපේ සභාවේ තාක්ෂණ නිලධාරීන් කවුරුවත් දන්නේ නෑ.මේ බෝක්කුව නිසා කිසිම වාහනයක් හරවන්න බෑ කියලා දැන් ගමේ කෙනෙක් කතා කරලා කීවා.ප්‍රාදේශීය සභා පාරක් නිසා අපේ තාක්ෂණ නිලධාරීන් මෙතනට යොමු කරලා අවශ්‍ය කටයුතු සිදු කරන්න.නැතිනම් බෝක්කුව කැඩුණොත් මහ ජනතාවගේ මුදල් අපරාදේ.මේ වන විට ඒ වැඩේ යනවා.එඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරලා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමණි,ඔබතුමා විශේෂ නිවේදන යටතේ සඳහන් කලා ප්‍රාදේශීය සභාවට අයිති මාර්ග සංවර්ධනය කිරීමේ දී තාක්ෂණ නිලධාරීන් යොදවලා සිදු කරන කාර්යය පිළිබඳව.ඒ පිළිබඳව අපේ අවධානය යොමු කරන්න,සභාවේ තීන්දුවක් ගන්න කියන කාරණය සම්බන්ධයෙන් ඔබතුමා පැහැදිලි කලා.ගරු සභාපතිතුමණි,අපේ සභාවේ තිබෙන මාර්ග වලට වෙනත් ආයතන වලින් මුදල් යොදවපුවාම,ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරී මහතුන් ඉන්නවා,වාහන තිබෙනවා.හැබැයි ඒ මාර්ග අපිට අයිති කියලා මේ සභාවට ඇස්තමේන්තු එවනවා.ඒ ඇස්තමේන්තු කරන්න මෙහාට දුන්නාම අපේ ඉන්න කාර්මික නිලධාරී මහත්වරුත්,ඒ වගේම අපේ තිබෙන සම්පත් හා වාහන සියල්ල මේකට භාවිත් කරනවා.හැබැයි මේකට ලැබෙන පරිපාලන වියදම් බොහෝම සුළු ප්‍රමාණයක් ලැබෙන්නේ.හැබැයි පඬුවස්නුවර ඉඳන් බෝධිමුල්ලට ගියාම බලන්න,මේ වාහන වලට වියදම් කරනවා රුපියල් පන් දහසකට අධික ප්‍රමාණයක්.හැබැයි මේ පරිපාලන වියදම් සුළු ප්‍රමාණයක් ලැබෙන්නේ.හැබැයි අර කෝටි 18 ක ප්‍රමාණයක් ගත්තානේ.ඇස්තමේන්තු කලා කෝටි 18 ක ප්‍රමාණයක්.සභාවේ සම්පත් යොදවපු ඒවාගේ කිසිම පල ප්‍රයෝජනයක් උනේ නෑ.හැමදාම අපේ මුදල් ලක්ෂ ගණනක් වැය කරනවා මේ වාහන වෙනුවෙන්.මේ නඩත්තු කටයුතු වෙනුවෙන්.සභාවේ කාර්මික නිලධාරී මහත්වරුන්ට අතිකාල දීමනා ගෙවීම් කරන්න වෙනවා.මේ සභාවේ සම්පත් හා මුදල් තමයි අපි විනාශ කරන්නේ.සමහර විට අපිට මේ ප්‍රාදේශීය සභාව තුල යම් කාර්යයක් කර ගන්න උනාම අපි දැක්කා පසුගිය දිනවල තිබුණ අපහසුතාවය.කාර්මික නිලධාරී මහතුන් තුන් දෙනාම එක දිගට වැඩ.හැබැයි මේ සභාව තුල කරන කාර්යයන් කරන්න ඔවුන්ට කාලයක් තිබුණේ නෑ.මම පැහැදිලිව කියනවා ඒක.ඒ තරම් ඒ අය කාර්යබහුල උනා.පාරක් බලන්න යන්න බැරි උනා.යම් යම් කාරණා සම්බන්ධයෙන් පරිභාහිර දේවල් ඒ අයට කරන්න සිදු උනා.ඒ වගේම මම පසුගිය සභාවෙත් කතා කලා.අපිට ලොකු අසාධාරණයක් සිදු වෙනවා.අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දෙන ඒවා ගිවිසුම්ගත වෙලා අධීක්ෂණය කරන්නේ ප්‍රාදේශීය සභාව.මේ සියලුම දේවල් අධීක්ෂණය කරද්දී ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න.අධීක්ෂණය කරලා මේ පාරවල් හදලා ගිවිසුම්ගත කාලය අවසන් වුණාම, රැඳවුම් කාලය ගත වී  මාස හයක් හෝ අවුරුද්දක් ගියාම මේ කාර්මික නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් කරලා මේ පාර සුදුසු තත්ත්වයේ තිබෙනවා රැඳවුම ගෙවන්න කියලා නිර්දේශ කරනවා.අවුරුදු එක මහාරකට පසුව දුන්න පාරවල් ටිකක්.හැබැයි අවුරුදු තුනකට ආසන්න කාලයක් ගියාට පසුව රැඳවුම් ගන්න ගිහාම ඒ කාර්මික නිලධාරීතුමා දුන්න තාක්ෂණ නිලධාරී වාර්තාව පිළිගන්නේ නෑ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්.ඔවුන් රැඳවුම් මුදල ගන්න ගිහාම චෙක් එක ගන්න ඒ අය නැවත බලන්න ඕන.පාරවල් හරියට තිබෙනවා නම් විතරයි දෙන්නේ.නැත්නම් දෙන්නේ නෑ.ඔබතුමා දන්නවා දෙල්ගෙදර වැව අසල පාර.පසුගිය කාලයේ වැහැලා අවුරුදු තුනකට පසුව පොඩි බැස්මක් වෙලා තිබෙනවා.වැඩිහිටි සමිති වලට කියා තිබෙනවා සංවර්ධන නිලධාරීන් නැවත සකස් කර තාක්ෂණ නිලධාරීන්ට  නැවත වාර්තාවක් ලබා දෙන්න කියලා.ඒ වාර්තාව පිළිගන්න බැරි නම් අපේ නිලධාරීන් හා සම්පත් යොදන එකෙන් වැඩක් නෑ.ඒ නිසා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලනවා,මේ සභාවේ අවධානය යොමු කර මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අපේ නිර්දේශ පිළිගන්න බැරිනම්, ඒ ඇස්තමේන්තු බැලීමේ

ප්‍රතිඵලයක් නෑ.සමහර විට ඉදිරියේ දී මේ ගම්වල තිබෙන ස්වේච්ඡා සංවිධාන කිසිම කෙනෙක් අපේ ගිවිසුම් වලට අත්සන් කරන්න එන්නේ නැති වෙයි.වැඩිහිටි සමිති වල ඉන්නේ වයස්ගත මිනිස්සු.ඒවාගේ තමයි දැන් මුදල් තිබෙන්නේ.ඔබතුමා විශේෂ නිවේදන යටතේ ඉදිරිපත් කල කාරණය සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කරලා,ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මුදල් නිදහස් කිරීමේ දී අපේ නිලධාරීන් දෙන දේ පිළිගන්න බැරි නම්, එකඟතාවකට ඇවිත් සභාවේ සම්පත් හා අතිකාල දීමනා සියල්ල යොදවා ,අපේ සභාවෙන් අපිට කර ගන්න තිබෙන දේවල් ඒ අයට දීලා, මේ සභාවේ තිබෙන කටයුතු පසෙකට යනවා නම්,කාර්මික නිලධාරීන්ට ඒ කටයුතු අධික කරනවා නම්, ඒක සාධාරණ නෑ.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

අපේ මනෝකුමාර ගරු මන්ත්‍රීතුමා කීව සමහර කාරණාත් එක්ක බලද්දී මම ඇත්තටම දේශපාලන කතාවක් නෙවෙයි කරන්නේ.විශේෂයෙන්ම අපි ගම්බද ජීවත් වන අය හැටියට එළවළු මිල වැඩි එක,අනෙකුත් භාණ්ඩ වැඩි එක පොදු ප්‍රශ්නයක් හැටියට තිබෙනවා.මම කියන්න උත්සාහා කරන්නේ ගම්බද පිරිසක් නියෝජනය කරන්න අපි බැදිලා ඉන්නවා.මමත් රජයේ නිලධාරියෙක් තමයි.නමුත් ගමක ඉන්නවා රජයේ නිලධාරීන් පස් දෙනෙක් හෝ හය දෙනෙක්.රජයේ වැටුප් ලබමින් ගම සංවර්ධනය කරන්න රජය විසින් නියෝජනය වෙලා තිබෙනවා.ඊට අමතරව අපි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු හැටියට ජනතාව නියෝජනය කරන පිරිසක් ඉන්නවා.අපි මිරිස් කිලෝ එක රු.1200.00 යි,රු.1000.00 යි කියනවා තමයි.අපිට කෘෂිකර්මය හා සම්බන්ධ නිලධාරී මහත්මයෙක් ඉන්නවා.සමෘද්ධි සංවර්ධන නිලධාරී මහත්මයෙක් ඉන්නවා.ආර්ථික සංවර්ධන නිලධාරී මහත්මයෙක් ඉන්නවා.ග්‍රාම නිලධාරී මහත්මයෙක් ඉන්නවා.පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියක් ඉන්නවා.ප්‍රජා සංවර්ධන නිලධාරී මහත්මයෙක් ඉන්නවා.ඔය විදිහට ගත්තාම සෑම ගමක්ම,සෑම ග්‍රාම නිලධාරී වසමක්ම රාජ්‍ය නිලධාරීන් පස් හය දෙනෙක් නියෝජනය කරනවා.මේ සියලු දෙනාම රජයේ වැටුප් ලබමින්,ඉහල පිරිවැයක් රජය ඒ නිලධාරීන් වෙනුවෙන් වැය කරනවා.නමුත් අපි පොහොර ප්‍රශ්නය ගත්තාම බොහෝ විට කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර කියන නිලධාරීවරයා ගමක ගෙවල් පහකට ගිහින් කොම්පෝස්ට් වලක් හදා ගන්නේ මෙහෙමයි කියලා නිලධාරීන් කී දෙනෙක් කීවාද මම දන්නේ නෑ.එතනට අපි එන්නේ නැතිනම් දේශපාලන පක්ෂය මොකක් උනත් අන්න එතනට අපිට ආපස්සට යන්න වෙනවා.නැතිනම් මොන රාජ්‍ය නායකයා මේ රට භාර ගත්තත් අපි ඒක හුරු කරන්නේ නැතිනම්,නිලධාරීන් බොහෝ විට නිකුත් කල චක්‍රලේඛය කියවලා බලලා ඒ අයට තිබෙන රාජකාරිය කරන මට්ටම අඩුයි.මම යෝජනා කරන්නේ ගම් මට්ටමේ මිනිස්සුත් එක්ක ඉන්න අපි මේ නිලධාරීන් එක්ක එකතු වෙලා ගමට මේ සංවර්ධන කටයුතු ටික සිදු කරන්න පටන් ගන්න කාලය ඇවිත් තිබෙනවා.මම හෝදින්ම දන්නවා සංවර්ධන කටයුතු වලට පාරවල් වල ආව මුදල් භාණ්ඩාගාරයට ආපසු කෝටි ගණන් චෙක් වලින් ආපසු ලියනවා.ඒ ලියන්නේ මේ පාරවල් වල විතරක් නෙවෙයි.සියලුම සංවර්ධන කටයුතු වලට එන මුදල් ඒ ගම්වල යොදවන්නේ නෑ.ඒකට නිලධාරීන් හැටියට ලොකු වගකීමක් පැහැර හැරලා තිබෙනවා.ඒ නිසා තමයි එහෙම වෙන්නේ.මම වගකීමෙන් කියනවා මම බලපු සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලක්ෂ 50 ක් සංවර්ධන ව්‍යාපෘති වලට ආවා.ඒකෙන් කිරි එළදෙනුන් දෙන්නෙක් විතරක් මිල දී ගෙන තිබුණා.ඉතිරි මුදල් දෙසැම්බර් 31 දිනට චෙක් පත ලියලා භාණ්ඩාගාරයට නැවත යවලා තිබෙනවා.ගම් මට්ටමේ මිනිස්සුත් එක්ක වැඩිපුරම ගැටෙන්නේ අපි.ඒ මිනිස්සු අපිට කියනවා අපිට කන්නවත් ඕන නෑ,පාර හදලා දෙන්න කියලා.හැබැයි එහෙම කියලා පාර හදලා ඉවර උන ගමන් කියනවා පාරවල් කන්නද කියලා.ඇත්තටම බඩු මිල වැඩිවෙලා තිබෙද්දී පාරවල් හදලා වැඩක් නෑ.ඊට වඩා ඔය මිල ගණන් අඩු කරන්න පොදු තීරණ අරන් බඩු මිල අඩු කලා නම් පාරවල් හදන එක නතර වෙලා ඒක ජනතාවට වටිනවා.ඒ උනාට මිනිස්සු යනකන්ම කියන්නේ අපිට පාරවල් හදලා දෙන්න.අපිට කන්නවත් ඕන නෑ.මේ පාරේ යන්න බෑ කියලා.පාරවල් හදලා ඉවර උනාම පාරවල් කන්නද කියනවා.ඒ නිසා මම කියන්න උත්සාහා කරන්නේ රාජ්‍ය නිලධාරීන් පහක් හයක් ඉන්නවා ගමකට.පවුල් 200 යි තිබෙන්නේ.පවුල් 200 සංවර්ධනය කරන්න අර පස් දෙනයි,අපි ගම් මට්ටමින් රට සම්බන්ධීකරණය කරන්න ඉන්න අය විදිහට මෙතනට යන තාක් මම හිතනවා මේ සංවර්ධන කටයුත්ත ඉදිරියට ගෙන යන්න බෑ.මම මේක අවධාරණය කරන්න හිතුවේ අපි එතනට පක්ෂ භේදයක් නැතිව අපේ අනාගත පරපුරට,අපි මිරිස් ගස් පහක් මල් පෝච්චියක හිටවා ගන්නේ නැතිව මිරිස් කිලෝ එක මෙච්චරයි කීවාට හරියන්නේ නෑ.කුස්සිය පිටුපස වලං හෝදන වතුර ටික දාන්න මිරිස් පැල කිහිපයක් හදා ගත්තා නම් මම හිතනවා තුන් හතර දෙනෙක් ඉන්න තැනකට ඇති.අපි මේ අදහස රජයේ නිලධාරීන් ගමට දෙන තැනට මේක යොමු කල යුතු කාලය ඇවිත් තිබෙනවා.අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා පෙ.ව.11.50 ට පමණ ගරු සභාවට පැමිණියා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමණි,අපි එන විටත් සභාවේ ගරු මන්ත්‍රීවරයෙක් මාරාන්තික උපවාසයක නිරත වෙලා ඉන්නවා.ඒක අපිට කිසිසේත්ම අදාල නොවුණත් මේ ඇති වී තිබෙන තත්ත්වය කුමක්ද කියන කාරණය සම්බන්ධව අපි දැන ගන්න කැමතියි.මේක පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.ඒ නිසා සභාව කියන නාමය තමයි හැමදේටම යන්නේ.ඒ නිසා මේ සම්බන්ධව දැන ගැනීමට මේ අවස්ථාවේ හෝ වෙනත් අවස්ථාවක අවස්ථාව ලබා දෙන්න කියන යෝජනාව මා ඉදිරිපත් කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

**ගරු මන්ත්‍රීතුමණි,මේ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට මේ අවස්ථාවේ අවස්ථාව ලබා දෙනවා.**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය පෙ.ව.11.53 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය පෙ.ව.11.53 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා - (එ.ජා.ප.)**

ගරු සභාපතිතුමණි,මේක සිදු වෙන්නේ සභාව ඉස්සරහා නෙවෙයි,ජල පවිත්‍රාගාරය ඉදිරිපිට තමයි මේක සිදු වෙන්නේ.මම කියන්නේ සිදු වෙනවාටම නෙවෙයි,බැරි වෙලාවත් මෙතනට ගල් ප්‍රහාරයක් හෝ මැර ප්‍රහාරයක් එල්ල වුණොත් වතුර බටයක් කැඩිලා ගියොත් ලීටර් දහ දොළොස් දාහක් වතුර අපතේ යනවා.ජනතාවට වතුර නැතිව යනවා.මේක වහාම ක්‍රියාත්මක වන පරිදි ජලාපවාහන මණ්ඩලයට කතා කරලා මේක මෙතනින් ඉවත් කරන්න පියවරක් ගන්න.ප්‍රශ්නයක් තිබෙනවා නම් තමන්ගේ පක්ෂ කාර්යාලය ළඟට ගියා නම් හරිනේ.ගරු සභාපතිතුමා හොඳට වැඩ කරනවා.ගරු මන්ත්‍රීවරුන්ට වැඩ කරන්න අවස්ථාව ලබා දී තිබෙනවා.මට පසුගිය අවුරුදු තුන හමාරට කෙට්ටිය කොට්ඨාසයට එක වීපී පහනක්,මෝටර් ග්‍රේඩරයක්,ජේ.සී.බී.යන්ත්‍රය ලැබුණේ නෑ.මම අද කොච්චර වැඩ කරලා තිබෙනවාද?වැසිකිළිවලට යන්න බැරිව ගෙවල් 10 ක් 15 ක් විතර.මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා ජේ.සී.බී.යන්ත්‍රය දාලා එම කටයුතු පිළිවෙලක් කලා.ඒ සම්බන්ධව පින් දෙනවා ඔබතුමාට.පැය හතරක් වතුර බැස්සුවා.මේ වගේ තමන්ගේ වාසියට වැඩ කරන,පෙට්ටි කඩ වලින් රුපියල් සියය දෙසීය එකතු කරන එක,එළවළු ලොරියෙන් සල්ලි ගත්ත ඒවා ඔබතුමාට මතක ඇති.මහ ඇමතිතුමාගෙන් ලියුමක් ගැස්සුවා එළවළු ලොරිය ඉවත් කරන්න.අවුරුදු කීයක් ගියාද ඔය එළවළු ලොරිය ඉවත් කරන්න.ඕකට කොච්චර සල්ලි ගත්තාද?පොලීසිය ළඟ තිබෙන මාළු කඩේ බලන්න.මාළු කඩෙන් රු.50,000.00 ක් අරන් තිබුණා.මේ විදිහට සභාවට ලැජ්ජා කරනවාට වඩා තමන්ට ප්‍රශ්නයක් තිබෙනවා නම් තමන්ගේ පක්ෂ මූලස්ථානය ළඟට ගිහින් නිදා ගත්තා නම් හොඳයි.මම ස්වාමීන් වහන්සේලාට ගරු කරන පුද්ගලයෙක්.ස්වාමීන් වහන්සේ නමක් ආප්ප කවනවා මම දැක්කා.ආප්ප කවපුවාම මාරාන්තික උපවාසයක් වෙන්නේ නැනේ. ස්වාමීන් වහන්සේලාත් දැන ගන්න ඕන ප්‍රශ්නයක් තිබෙනවා නම් උපදේශයක් දෙන්න.ඒ නිසා ගරු සභාපතිතුමණි,මේ අය වහාම මෙතනින් ඉවත් කරන්න.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)**

ගරු සභාපතිතුමණි,මේක පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.ඔබතුමා සභාවේ ගරු සභාපතිතුමා.ඔබතුමා සභාවේ ගරු සභාපතිවරයා විදිහට පත් වුණේ මේ සභවේ බහුතර මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන්.ඔබතුමා දරණ පක්ෂය කුමක් වුණත් ඒ සම්බන්ධව තිබෙන ගැටලු අපිට අදාල නෑ.මේක පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව. පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිවරයා.මේ නගරයේ හරි කොහේ හරි,ඔබතුමන්ලාගේ පක්ෂ මූලස්ථානය නෙළුම් මාවතේ හරි ඕන දෙයක් කලාට අපිට ගැටළුවක් නෑ.බහුතර මන්ත්‍රීවරුගේ ඡන්දයෙන් ඔබතුමා පත් වෙලා අද මේ සභාවේ කටයුතු ඉතාමත් සාර්ථකව කරගෙන යනවා.මේ සභාවේ කටයුතු ගැනවත් වෙන කිසි දෙයක් ගැනවත් ගැටළුවක් නෑ.හැබැයි මේ ප්‍රශ්නේ තිබෙන්නේ සභාවට බාහිර දෙයක් නම් එළියේ නෙනෙයි,කොළඹ හරි ගිහින් එතන ඒවා කර ගන්න පුළුවන්.සභාවේ සම්පත් වලට වන හානිය,සභාවට එන ජනතාව මන්ත්‍රීවරු හමුවෙන්නේ ඔතනින්.එතකොට වැරදි

ප්‍රතිරූපයක් මැවෙනවා.ඒ නිසා මේ සම්බන්ධව හා ඊට අමතරව පරිභාහිරව වෙනත් කණ්ඩායම්,විවිධ මත දරණ පුද්ගලයෝ ඔතන ඇවිත් ගැටෙන්න පුළුවන්.මොකද මේක සභාව ඉදිරිපිට.මෙතන නැතිව හෙට්ටිපොල නගරයේ හරි,කොළඹ හරි,පක්ෂ කාර්යාලය ළඟ හරි වෙන ඕනම තැනක් භාවිතා කලා නම් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව කියන නම,අපි දැක්කා ඊයේ මාධ්‍යයෙන්.සභාවට වන හානිය සම්බන්ධව සභාවේ මන්ත්‍රීවරු විදිහට අපි ඒකට විරෝධය හා අපේ අප්‍රසාදය පල කරනවා.මේ සම්බන්ධව ඔබතුමා පියවරක් ගනියි කියන විශ්වාසය තිබෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

සභාවේ සිටින සියලු දෙනාටම සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.විරෝධය පෑමේ හා උපවාස කිරීමේ අයිතිය සම්බන්ධයෙන් මම කතා කරන්නේ නෑ.ඒ අයිතිය මම පිළිගන්නවා.කරන දේ හරිද වැරදිද කියලා තීරණය කරන එක ඒ අය සතුයි.2022 වර්ෂයේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සිටින ජනතාවටත්, ලක්වාසී ජනතාවටත් තුන් වේල කාලා ඉන්න පුළුවන්,හුස්මක් ගන්න පුළුවන්,සතුටින් ජීවත් වෙන්න පුළුවන් රටක් හදා ගන්න පුළුවන් නැණ නුවණ පහල වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.හේතුව ගරු මන්ත්‍රීතුමිය පවුලේ අය මිරිස් පැල සෑදීම ගැන කතා කලා බඩු මිල වැඩි වීම සම්බන්ධව.ඒ නිසා අපි කවුරුත් මතක තියා ගන්න ඕන යැපුම් කෘෂිකර්මාන්තයයි කෘෂි ආර්ථිකයයි කියන්නේ දෙකක් කියලා.උද්දමනය වැඩි වෙන්න වැඩි වෙන්න,බඩු මිල වැඩි වෙන්න වැඩි වෙන්න මිරිස් ගස් පහක් හදා ගන්න පුළුවන් අයත් ඉන්නවා.හැබැයි මේ රටේ ඉන්නවා ටර්න් එකට නිදා ගන්න මිනිස්සු.මොකුත් නෑ.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,මේ අවස්ථාව ලබා දී තිබෙන්නේ ඇති වී තිබෙන විශේෂ තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරන්නයි.ඔබතුමාට අදහසක් ඉදිරිපත් කරන්න තිබෙනවා නම් ඊළඟ සභා වාරයට ඔබතුමාගේ අදහස් ඉදිරිපත් කරන්න.මොකද මාතෘකා කිහිපයක් දැන් මෙතන යනවා.මේ අවස්ථාව දුන්නේ විශේෂ අවස්ථාවක් හැටියටයි.ඔබතුමාට අවශ්‍ය නම් ඒ සම්බන්ධව කතා කරන්න පුළුවන්.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

ගරු සභාපතිතුමා,සමාවෙන්න.මම මේ කතා කරන්න හත් වෙනි වතාව නැගිට්ටේ.අපරාදේ මේ කාලය.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,ඔබතුමාට බාධා කරනවා නෙවෙයි.හත් වතාවක් නැගිටින්න ඕන නෑ.ඔබතුමා මේ පනත අනුව කටයුතු කරන්නකෝ.යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ඉදිරිපත් කරන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

ගරු සභාපතිතුමා,ඒක මෙතන සිදු වුණේ නැනේ.ඒ අසාධාරණය කරන්න එපා ගරු සභාපතිතුමා.වෙනත් කරුණු යටතේ දැන් මෙතන මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කතා කලා.හැබැයි ඒ කිසි කෙනෙක් ඔබතුමාට භාර දීලා තිබුණේ නෑ කතා කරන්න ඕන කියලා.ඒ නිසා එහෙම කරන්න එපා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

මේ මන්ත්‍රීවරු ඉල්ලීම් කලා,අද ඇති වී තිබෙන විශේෂ අවස්ථාව සම්බන්ධව.ඔබතුමාගේ කතාව විනාඩි දෙකකින් සිදු කරන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා - (ජ.වි.පෙ.)</u>**

ගරු සභාපතිතුමණි,මම පොඩි කතාවක් කරන්නේ.මම හිතන්නේ ඔබතුමන්ලාට මේ රිදෙන්නේ සතුටින් ජීවත් වෙන්න පුළුවන් රටක් හදා ගන්න නැණ නුවණ මිනිස්සුන්ට පහල වෙන්න ඕන කීව එකට වෙන්න ඇති.එහෙනම් ඒකම සිදු වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමණි,මම ඇත්තටම සතුටු වෙනවා ඔය වගේ උපවාසයක් පවත්වන එකටත්,අපි දැක්කනේ මටත් විරුද්ධව යනවා.ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ලංකාවෙන්ම ශාඛා සමිති හැටකට වැඩි ප්‍රමාණයක් පිහිටවපු මනුස්සයාට විරුද්ධව තමයි අද මේ කොමිස්කාරයෙක් මෙතන උපවාස කරන්නේ.බොහෝම කණගාටු වෙනවා.පක්ෂයක් වෙනුවෙන් පක්ෂයේ ඉහල අය ගන්න ඕන තීන්දු තීරණ ගනියි.මගේ විශ්වාසයක් තිබෙනවා.

- ➢ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා ප.ව.12.00 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පළමු වතාවට මාධ්‍ය සාකච්ඡාවක් තියලා එළියට බැහැපු මනුස්සයෙකුට විරුද්ධව තමයි මේ දේ සිදු කරන්නේ.පක්ෂ නායකයෝ ඔබතුමා වෙනුවෙන් අදටත් පෙනී සිටියි.පහල බිම් මට්ටමේ සිටින දේශපාලන නායකයෝ කුමන ක්‍රියාමාර්ග ගත්තත් ඉහල මට්ටමේ ඉන්න දේශපාලන නායකත්වය තාමත් ඔබතුමා

එක්ක රැඳී සිටීම ගැන අපි සතුටු වෙනවා.ඒකට හේතුව ඔබතුමා තමයි ලංකාවෙන්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ශාඛා සමිති පිහිටුවලා එළියට බැහැලා ගිය පළමු පුද්ගලයා.ඒ පුද්ගලයාට විරුද්ධව මම හිතන්නේ නෑ ඒ වගේ විනය ක්‍රියාමාර්ග ගනියි කියලා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)**

ගරු සභාපතිතුමා,මේ ප්‍රශ්නයේ දී ඒ අයට මාරාන්තික උපවාස කරන්න අයිතියක් තිබෙනවා.හැබැයි ඊයේ රෑට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා කෑම ගෙනත් දුන්නා.අද උදේට පන්සලේ ස්වාමීන් වහන්සේ වැඩම කරලා ආප්ප කැව්වා.එතකොට මාරාන්තික උපවාසයක් වෙන්නේ නෑ.අපි දැන් අපේ සභාවෙන් දීලා නැති උනත් වයර් එකක් ඇදලා ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ලයිට් එකක් දාලා තිබෙනවා.ඒක සම්පූර්ණයෙන්ම වැරදියි.අදාල නිලධාරීන්ට මේ සම්බන්ධව දැනුම් දෙන්න.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා ප.ව.12.04 ට පමණ ගරු සභාවට පැමිණියා.

අනෙක් කාරණය මැර ප්‍රහාර කොයි වෙලාවේ සිදු වෙයිද දන්නේ නෑ.ඒකෙන් අලාභ හානියක් සිදු වුණොත් සභාවට ප්‍රශ්නයක් නොවෙනවා නම්, ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ දේවල් වලට හානියක් වුණොත් අපිට කරන්න දෙයක් නෑ.නමුත් දැනුවත් කිරීම ඔබතුමා සතු යුතුකමක්.ඒක නිසා ඒ උපවාසය කරන්නේ ඇයි කියලා ආසනයේ මිනිස්සු දන්නේ නැනේ.මේකේ කෑම නැති උනාම ඔහොම තමයි.අර පෙට්ටි කඩ පසුගිය කාලයේ දීලා තිබෙන්නේ දවසකට රු.220.00 ගානේ එකතු කරලා.අපි දීලා තිබෙන්නේ දවසට රුපියල් විස්සයි,මාසෙට රු.500.00 යි.අවුරුද්දට මුදල් රු.6000.00 ක් අය කලා.ආපසු ගෙවන පදනම මත තැන්පත් මුදල් රු.2000.00ක් අය කලා.ඒකේ පෙට්ටි කඩ ටික දීගන්න බැරි උනාම සමාජ මාධ්‍යය ජාල වල කොච්චර ගැහුවාද?අපි දුන්නේ ජීවත් වෙන්න මිනිස්සුන්ට.මෙතන ඉඳගෙන උපවාස කරද්දී මිනිස්සු බලාපොරොත්තු වෙන්නේ මොකක්ද මේ වැඩේ.අපෙන් ඇහුවාම කියනවා ඕක පොඩි ප්‍රශ්නයක්.මාළු කඩෙන්,වඩේ කඩෙන් ගන්න බෑ,නවත්තලා තිබෙනවා.ඒ අමාරුව තිබෙනවා.ඒ අමාරුවට දැන් ඔබතුමා කතා කරන්න කීවා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතාටත්, ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතාටත් ප්‍රතිපාදන දීලා තිබෙනවා.අපේ අයටයි දීලා නැත්තේ.ඒ දීපු අයමනේ මේවා කරන්නේ.ඒ නිසා වහාම නවත්වන්න.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා ප.ව.12.07 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

අපි දන්නවා රංජිත් උපාලි ගරු සභාපතිතුමා ඉන්න කාලේ එක වීථි ලාම්පුවක්වත්,මෝටර් ග්‍රේඩරයක්වත් මොකක්වත් දුන්නේ නෑ.ඒකාධිපති බලතල පාවිච්චි කලේ.එමල් ප්‍රියන්ත ගරු සභාපතිතුමා කාලේ එතුමා කරගෙන ගියා.ඒක තමයි රංජිත් උපාලි ගරු සභාපතිතුමාගේ අයවැය අපි කට්ටිය එකතු වෙලා පැරැද්දුවේ.ඔබතුමාගේ අයවැයට සහයෝගය දුන්න අය තමයි මේ ඉන්නේ.අයවැයට සහයෝගය ලබා නොදී වර්ජනය කලා 16 දෙනෙක්.නමුත් බලනකොට ඒ අයටත් දීලා.කෑම කන නිසා සතියක් විතර උපවාස කරන්න පුළුවන්.කෑම නොකනවා නම් දවස් දෙකෙන් ඉවරයි.ගරු සභාපතිතුමා,ඔබතුමා දැනුවත් කරන්න ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ඔබතුමන්ලා අනවශ්‍ය වැඩක් කරලා තිබෙන්නේ.අපේ සභාව ඉදිරිපිටට ඔබතුමාලා වීථි ලාම්පුවක් දාලා තිබෙනවා.ඒක වැරදියි.අනික ගේට්ටුව ඇතුලේ සිදු වුණා නම් ගරු සභාපතිතුමාට හා ලේකම්තුමාට මේක කරන්න පුළුවන්. ගේට්ටුවෙන් එහා පැත්තේ සිවිල් නඩුවක් වෙනවා.ඒක නවත්වන්න පුළුවන් වෙන ක්‍රමයකින්.ඒ ක්‍රමවේදයක් තිබෙනවා.ඒක ක්‍රියාත්මක වෙයි තව දවස් දෙක තුනක් යනකොට.සතියක් විතර නිදාගෙන ඉඳියි,ප්‍රශ්නයක් නෑ.කෑම බීම හම්බවෙනවා.නිදාගෙන ඉන්නයි තිබෙන්නේ.ඒ නිසා අපි මේකට වැඩි කලබල වෙන්න හොඳ නෑ.ටික දවසක් නිදාගෙන ඉඳියි.එතකොට නාමල් රාජපක්ෂ මහතා හරි මහින්ද රාජපක්ෂ මහතා හරි ඇවිත් තැඹිලි දීලා නැගිට්ටවයිනේ.ඔබතුමා ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය දැනුවත් කරන්න.මනෝකුමාර ගරු මන්ත්‍රීතුමා කීවේ මේක අයින් කරන්න ඕනමයි කියලා.ඉතිරි අයගෙත් මතය ඕකම තමයි.ගරු සභාපතිතුමා,ඔබතුමා ඒකාධිපති බලතල පාවිච්චි කරලා සභාවේ ඉන්නවා නම් ඒක කලාට කමක් නෑ.දැන් බලනකොට සුනිල් ගරු මන්ත්‍රීතුමාට දීලාත් නෑ,මනෝ කුමාර ගරු මන්ත්‍රීතුමාට දීලාත් නෑ.දීලා තිබෙන්නේ උප සභාපතිතුමාටයි, සරත්චන්ද්‍ර ජයතිලක ගරු මන්ත්‍රීතුමාටයි.ඒක වැරදියිනේ.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)**

අද උදෑසන අපි දකින්න හොඳ නැති අශෝභන සිද්දියක් අපේ ගේට්ටුව ළඟදි දැක්කා.එතන බැනර් එකකුත් ගහලා තිබෙනවා පක්ෂයේ විනය කඩ කරලා තිබෙන සභාපතිතුමා හා මන්ත්‍රීතුමාව පක්ෂයෙන් නෙරපන්න.ඇත්තම මම නම් විපක්ෂයේ මන්ත්‍රීවරියක් වශයෙන් මම නම් හිතන්නේ නෑ අපේ ගරු සභාපතිතුමා,අපි හැමෝම දන්නවා ගරු සභාපති ධූරයට පත් වූ දිනයේ සිට සියලු දෙනාටම සමානව කටයුතු කලා මිසක් අපි සියලු දෙනාම දන්න කාරණයක්

තමයි කාටවත් වැඩි සැලකිල්ලක් දැක්වූවේ නෑ.සභාවේ ගරු මන්ත්‍රීවරු වශයෙන් අපිට සභාවෙන් ගන්න තිබෙන්නේ වැසිකිළි පෝච්චි,වීපී පහන්,බෝක්කු කැට වගේ දේවල්.ගරු සභාපතිතුමා ඒවා සියලු දෙනාටම එක සමානව බෙදපු බව මම දන්නවා.ඒ නිසා ඇත්තටම කණගාටුයි.එතුමා ඔය විදිහට උද්ඝෝෂණ කරනවා නම් උද්ඝෝෂණය කරන්න ඕන කාරණය ඕක නෙවෙයි.ඊට වඩා කාරණා බොහෝ දේවල් ඒ අයගේ පක්ෂයෙන් අපේ සමාජයට සිදු වී තිබෙනවා අකටයුතුකම්.බඩු මිල ඉහල ගිහින්.ජනතාවට ජීවත් වෙන්න අමාරු නිසා හැමදාම පාරට බැහැලා ඔවුන් උද්ඝෝෂණ සිදු කරනවා.නිෂ්ඵල කාරණයකට මේ පෙළ ගැහිලා තිබෙන්නේ.ඇත්තටම කණගාටුයි.ඒ වගේම සද්නා දිල්හානි ගරු මන්ත්‍රීතුමිය කියනවා මිරිස් පැල දෙක තුනක් හදන්න කියලා.අපි එතුමියට කියන්නේ මේ බඩු මිල ඉහල යන එක මහ ජනතාවගේ කර පිටින් පටවන්න හොඳ නෑ.ඇත්තටම පාලකයෝ යහපත් නම්,පාලනය කරන්න සැලසුමක් ඇතිව මේක භාර ගත්තා නම් අපිට මේ විදිහට වෙන්නේ නෑ.සභාවට නින්දාවක් මේ වගේ අසුභ දර්ශන සභාව ඉස්සරහා තිබෙන එක.ඒ නිසා ඔබතුමා මේකට නීත්‍යානුකූලව කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමණි,ඔබතුමා 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කල අයවැයට මේ මන්ත්‍රී මණ්ඩලය කිසිම සහයෝගයක් නොදී මේ කරන උපවාසය සදාචාරාත්මක නෑ.කිසිම අයිතියක් නෑ කියන එක මම ප්‍රකාශ කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීවරුණි,අද මේ විශේෂ සිද්ධියක් නිසා ඔබතුමන්ලාට මම මේ විශේෂ අවස්ථාව ලබා දුන්නේ.ඊයේ උදේ ඉඳන් මේ උපවාසය පටන් ගත්තා.සභාවට එනකම් මම දන්නේ නෑ ඒ වගේ සිද්ධියක් වෙනවා කියලා.තමන්ගේ අයිතිවාසිකම් දිනා ගන්න වැඩ වර්ජන කරන්න,උද්ඝෝෂණ කරන්න අයිතිය තිබෙනවා.ඒවා ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්.ඒවා කරන්න පුළුවන්.හැබැයි දැන් මෙතනදී කල උපවාසය සම්බන්ධව මම සියලු දෙනා දැනුවත් කරලා තිබෙනවා.පොලිස් ස්ථානාධිපතිතුමා,කොමසාරිස්තුමා,පක්ෂයේ ඉහල මට්ටමේ අය දැනුවත් කලා.මෙතන මේ උපවාසය සම්බන්ධව මෙතන ගරු මන්ත්‍රීතුමන්ලා අතිනුත් මේකේ තිබෙන අවධානම් තත්ත්වයක් සම්බන්ධව කියවුණා.හැබැයි මේ අවධානම මට භාර ගන්න බෑ.මම ඊයේ සවස 6.45 විතර සභාවෙන් ගියේ.මම යනකොට ආරක්ෂක අංශයේ සිටි මහත්මයාට කියලා ගියා සභාවේ අපේ භූමිය ඇතුලට කිසිම කෙනෙකුට එන්න දෙන්න එපා,අගුලු දාලා තියන්න කියලා.ටික වෙලාවක් යන්න කලින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ උපවාස කරන අපේ සහෝදර මන්ත්‍රීවරු කණ්ඩායමක් සභාව ඇතුලට ආවා.ඇවිත් වැසිකිළි පහසුකම් ඉල්ලුවා මගෙන්.මම කීවා මට ඒ වැඩේ කරන්න බෑ.මෙතනට කවුරු කවුරු එයිද කවුද දන්නේ.ආරක්ෂාව පිළිබඳව පොලිස් ස්ථානාධිපතිතුමාව දැනුවත් කලා.ජල පොම්පාගාරයෙන් විදුලිය දුන්නා නම් ඒ අය කරලා තිබෙන්නේ වැරදි වැඩක්.ඒක ලේකම්තුමා සොයා බලන්න.මට කොමසාරිස්තුමා උපදෙස් දුන්නේ කිසිම කෙනෙකුට සභාවට ඇතුල් වෙන්න දෙන්න එපා කියලා.ඒ නිසා මේවා වැරදි වැඩ.මේ අයට අද කරන්න තිබෙන්නේ මේවා නෙවෙයි.උපවාස කරලා මාව මේ සභාපතිකමෙන් ඉවත් කරන්න ඔය තරම් දඟලන්න දෙයක් නෑ.2018 පලාත් පාලන පනත අනුව පවත්වපු මැතිවරණයෙන් ජනතා පරමාධිපත්‍යය අනුව මේ සභාවට තේරී පත් වූ මා ඇතු ලු ගරු මන්ත්‍රීතුමන්ලා 18 දෙනෙක් ඉන්නවා.ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් අනුව  මම මේ සභාවේ ගරු සභාපතිවරයා උනා.මේක නීත්‍යානුකූල නැතිනම් මේ නින්දා අපහාස නොකර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට නින්දා අපහාස නොකර අධිකරණ ක්‍රියාමාර්ග ගෙන මාව අයින් කරන්න කියන්න.මම මේ කරන වැඩේ අනුමත කරන්නේ නෑ.මේක මගේ පක්ෂයට කරන බලවත් හානියක්.අද අපිට තිබෙන්නේ මේවා කරන්න නෙවෙයි.අද පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරු සියලු දෙනාව මම එකතු කරගෙන ඉන්නේ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරුන්ටත් මම හැම දෙයක්ම දෙනවා.මේ ඔක්කෝම එකතු කරගෙන අද මේ රට පත්වෙලා තිබෙන තත්ත්වයෙන් ගොඩ ගෙන පළාත් පාලන ආයතනයක් ලෙසට අපිට යම් සේවයක් ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් නම් ඒ සඳහා අපි ඒකරාශී විය යුතුයි.මම හැම මොහොතකම කියන්නේ තම තමන්ගේ දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති මැතිවරණයක් ආවාම ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන්න.මේ කිසිම මන්ත්‍රීවරයෙකුට මම ආරාධනා කරලා නෑ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මමත් එක්ක එකතු වෙන්න කියලා.ඒ ගරු මන්ත්‍රීතුමන්ලා කිසිම කෙනෙක් මට කියලා නෑ,කියන්නේත් නෑ ඔය පක්ෂය අත හැරලා මේ පක්ෂයට එන්න කියලා.ඒක නෙවෙයි අපේ අරමුණ.ඔබතුමන්ලා මම ගැන ලොකු බලාපොරොත්තුවක් තිබුණා.අද පඩුවස්නුවර ජතාව විශාල බලාපොරොත්තුවක් තිබෙනවා අපි ගැන.මේවාගෙන් රිදුණ අය ඉන්නවා.රිදුණ අය තමයි මේ උපවාස කරන්නේ.ඒකට මට කරන්න දෙයක් නෑ.මේ ආයතනයට කිසියම් අලාභ හානියක් සිදු වුනොත් එතන නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ ඡායාරූප අපි ළඟ තිබෙනවා.ඒ සියලු දේට ජයන්ත හේරත් මන්ත්‍රීතුමා ප්‍රමුඛ ඒ කණ්ඩායම  වග කියන්න ඕන.උපවාස කරන්න ඕන නම් එහා පැත්තේ පිට්ටනිය හදලා දෙන්නම්.ඔබතුමන්ලා අදහස් ඉදිරිපත් කලා.උපවාසකරුවන් පිළිබඳව සැබෑ හෙළිදරව්ව අද මෙතන සිදු වුණා.මාධ්‍යය මෙතන ඉන්නවා.ඔබතුමන්ලා දෙන්න මේවා.පැහැදිලිවම මම මෙතන ඉන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ආරක්ෂා

කරන්නයි.හැබැයි සහෝදර පක්ෂ තිබෙනවා.ඒ පක්ෂ වලට ඒ ශක්තිය මම ආරක්ෂා කරලා දෙනවා.විපක්ෂයේ මන්තීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ඉන්නවා.ඔබතුමන්ලා 37 දෙනාම මේ ආසනයේ වැඩ කරන්න ඕන.ඒක තමයි මගේ අරමුණ.මේකට පටහැනිව වැඩ කරන අය මේ වගේ දේවල් කරන්නේ අපේ අතිගරු ජනාධිපති සෝටාභය රාජපක්ෂ මැතිතුමාට,මහින්ද රාජපක්ෂ ගරු අග්‍රාමාත්‍යතුමාට,අපේ ජාතික සංවිධායක බැසිල් රාජපක්ෂ මැතිතුමාට හා මට විරුද්ධව තමයි මේ පක්ෂයේ අය මේ වගේ දේවල් කරන්නේ.ඒවා මම ලිසිකුලෙන් යුතුව හෙලා දකිනවා.මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා ඔබතුමන්ලාට විසඳ ගන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමන්ලා මා එක්ක සාකච්ඡා කරන්න.ඒ ඕනම අවස්ථාවක මම ඒවා දෙන්න ලෑස්තියි.ඒ වගේම මම විනය විරෝධී විදිහට මේ සභාවේ තනතුරේ වාඩි වෙලා ඉන්නවා නම් අධිකරණයට ගිහින් නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් අරගෙන මේ තනතුරෙන් මාව මුදා හරින්න,ඔය උපවාසය අතහරින්න කියලා මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. 2022 වර්ෂය වාසනාවන්ත නිදුක් නිරෝගී සුභ නව වසරක් ලෙස ගත කිරීමට සියලු දෙනාට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත් ,2022 වර්ෂයේ ජනවාරි මස මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තුතිය පිරිනමන බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.ප.ව.12.20 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

සටහන් කලේ :පී.ඒ.ඩී.එස්.දිසානායක,කළමනාකරණ සේවා නිලධාරී.

වාර්තා කලේ :එච්.ඒ.ජී.නිශ්ශංක,ලේකම්,පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.